SAHASRA Manpower වෙතින් ගෘහසේවක/ සේවිකාවන්, සාත්තු සේවිකාවන්, නැනීවරුන් ඇතුළු සියලුම සේවකයින් අප ආයතනයෙන් ලබාගත හැක. වසරක වගකීමක් සහිතව විශ්වසනීය සේවයකට අමතන්න. **Reg: 9130. 0775935970, 0814289794** L360443-1

අංගොඩ කැළණිමුල්ල නිවසක වැඩ සඳහා දක්ෂ අවංක ප්‍රසන්න සේවිකාවක් අවශ්‍යයි. 0777354908 L361192-1

අකලංක සේවිකාවක් අවශ්‍යයි. 30 - 50, කඩුවෙල 4 සිටින නිවසකට වැටුප 25000/-. සියලු පහසුකම්. 0703865042, 0718030625. L363915-1

අකුරැස්ස අවුරුදු දෙකක දරුවා බලාගැනීමට සේවිකාවක් අවශ්‍යයි. දිනපතා පැමිණීමට හෝ නැවතීමට වැටුප සාකච්ඡා කර ගත හැක. 0705-247661 L362037-1

අගනුවර, කෝට්ටේ ප්‍රදේශයේ වෛද්‍යවරියකගේ නිවසේ නැවතී සේවය කිරීමට, 30- 55 අතර සේවිකාවක් අවශ්‍යයි. මසකට 35,000/- 0779764410. L363034-1

අනුරාධපුර දිස්ත්‍රික්කයේ තඹුත්තේගම නගරයේ නිවසක නතරවී වැඩ කිරීමට සහයිකාවක් අවශ්‍යයි. වැටුප 25000/- 0712250473. L360137-1

අනුරාධපුර නූවර වැව වලව්වත්තේ නිවසක නැවතී සේවය කිරීමට ආහාර පාන සැකසීමට සහ නිවසේ වැඩට අත්උදව්වට ගැහැණු කෙනෙකු අවශ්‍යයි. අමතන්න. 0715772004, 0779902004 L363374-1

අනුරාධපුර නැවතී සේවයට ගෘහ සේවිකාවක් අවශ්‍යයි. මාසික වැටුප රුපියල් 30,000 විමසීම්. 0701316716 L364816-1

අනුරාධපුර නගරයේ නිවසක අවුරුදු 10 ගැහැණු ළමයකු බලාගැනීම මෙන්ම ඇයගේ අධ්‍යාපන කටයුතුවලට සහය විය හැකි හා නිවසේ සියලු වැඩකටයුතු පිරිසිදුව පිළිවෙලකට නැවතී සේවය කලහැකි පවුල් බරින් තොර කාන්තාවක් අවශ්‍යයි. 0741007312, 0741007308, 0741007307, 0712484522, 0252223740 L367252-1

අනුරාධපුර මාතලේ හංදියේ පදිංචි ගුරුවරියකට ගෙදර වැඩ කටයුතු සඳහා අවුරුදු (35-50) අතර කාන්තාවක් සොයයි. 0706940476, 0252057827 L364636-1

අප නිවසේ දෙදෙනෙකු පමණයි. නැවතී සේවය කිරීමට නිරෝගී විශ්වාසවන්ත ගෘහසේවිකාවක් අවශ්‍යයි. 30000/- තලාහේන මාලඹේ. 0773939020, 0112790864 L364673-1

අප නිවසේ නතරවී අප පවුලේ සාමාජිකයින් පස් දෙනාට කෑම රසවත් ලෙස පිළියෙල කිරීමට දන්නා 50-65 අතර කාන්තාවක් අවශ්‍යයි. මූලික වැටුප 30,000/- අමතර දීමනා ද සහිතයි. ආහාර පිසීම පමණයි කළ යුත්තේ වෙනත් කිසිදු වැඩක් නොමැත. 0740141737 L365630-1

අප නිවසේ පෙරදිග/ අපරදිග කෑම පිසීමට දන්නා කාන්තාවක් හෝ පිරිමි අයෙකු නැවතී සේවය කිරීමට අවශ්‍යයි. ඉහල වැටුප්. නුගේගොඩ. 077-6698400 L359973-1

අප නිවසේ හතර දෙනෙක් පමණයි. ඉවුම්, පිහුම් පිරිසිදු කිරීම හා අවු. 3/6 දරුවන් දෙනෙකු බැලීමට කඩිසර පිරිසිදු කාන්තාවක් අවශ්‍යයි. වැටුප 45,000/- 0767448589 L364658-1

අප නුගේගොඩ දෙදෙනෙකු සිටින තනි තට්ටුවේ නිවසේ නතරවී මවගේ හා ගෙදර වැඩට අවු. 50 පමණ කාන්තාවක් අවශ්‍යයි. 0786338044. L366083-1

අප පන්නිපිටිය නිවසේ නැවතී ගෙදර වැඩකිරීමට නිරෝගී සේවිකාවක් අවශ්‍යයි. 0716904664 L363851-1

අපගේ උයන පිහන වැඩ හා සහෝදරියගේ බබා බලාගැනීමට 55 අඩු නැවතී සේවයට සේවිකාවන් දෙදෙනෙක් අවශ්‍යයි. 35,000/- 0765673793, 0720992970 L367115-1

අපගේ නුගේගොඩ නිවසේ නැවතී මිදුලේ වැඩට 60 වැඩි කෙනෙකුට කෑම සමඟ 15,000/- ගෙවමි. 0775066115, 0718950439 L360818-1

අම්පාර නිවසක නැවතී වයස අවුරුද්දක ළමයෙකු බලාගැනීම සඳහා කාන්තාවක් අවශ්‍යයි. 0764403433, 0716770693 L366802-1

අලව්ව නිවසක නතරවී වැඩකිරීමට කැමති වයස අවුරුදු 60 අඩු කාන්තාවක් අවශ්‍යව ඇත. වැටුප 30000/- 071-4222218 L365217-1

අවංක කාර්යක්ෂම ගෘහ සේවිකාවන් ඇත. (රජයේ ලියාපදිංචි) නාවල තලවතුගොඩ ඩොමස්ටික්විඩ් සර්විස්. 0778107529, 0770832321 L358666-1

අවිස්සාවේල්ල ප්‍රදේශයේ අවු-2 වයසැති කුඩා දරුවකු සිටින නිවසක ගෙදර වැඩට සහාය වීම සඳහා නැවතී සේවය කිරීමට අවු. 40-60 අතර නිරෝගී කාන්තාවක් අවශ්‍යයි. නැවතීමට වෙනම කාමරයක් ඇත. වැටුප 25,000/-. 0723449689. L367920-1

අවු. 11 දරුවෙකු නිවසේ සිට නතර වී රැකබලා ගැනීමට මැදි වයසේ කාන්තාවක් අවශ්‍යයි. 076-9648450 L366531-1

අවු. 40 ට අඩු නතරවී වැඩ කිරීමට ගෘහ සේවිකාවක් අවශ්‍යවී තිබේ. 0774400390. L363834-1

අවුරුදු 18ත් 30ත් අතර, නිවසක සේවය සඳහා සේවිකාවක් අවශ්‍යව ඇත. ආකර්ෂණීය වැටුප්. අමතුම් 0717912200 L361339-1

අවුරුදු 40 වැඩි ගෘහ සේවයට නැවතී සේවය කළ හැකි අයෙකු අවශ්‍යයි. 0759701426 L360941-1

අවුරුදු 55ට අඩු, වැඩිහිටි නිවසක 12 දෙනෙකුට ආහාර පිළියෙල කිරීම සඳහා නැවතී සේවය කළ හැකි කාන්තා සේවිකාවක් අවශ්‍යයි. අමතන්න. 0773186787. L366193-1

අවුරුදු එකහමාරක් වයසැති දරුවෙකු බලාගැනීම සඳහා පළපුරුදු අයෙකු අවශ්‍යයි. කහතුඩුව, වෙනිවැල්කොළ දු.ක. 0770-213792 L367149-1

අවුරුදු දෙකක දරුවෙකු බැලීමට වයස 35-55 අතර කාරුණික කාන්තාවක් අවශ්‍යයි. සියලුම පහසුකම් සහිතව. 35000/- (නිවසේ අනෙකුත් වැඩ නොමැත) 0710938491, 0774212049 L366330-1

අසනීප මව බලාගනිමින් ගේදොර වැඩ කිරීමට කැමැති අවු. 60-70 අතර කාරුණික තැනැත්තියක් සොයයි. 0777442182 L365753-1

ඇවිදීමට නොහැකි රෝගී වයසක කාන්තාවක් නැවතී බලා ගැනීමට හැකි වයස 45ට අඩු ශක්තිමත් කාන්තාවක් අවශ්‍යයි. 0718012071 L366594-1

ඉහුම් පිහුම් ගෙදර දොර වැඩ කිරීමට ගැහැණු කෙනෙක් අවශ්‍යයි. අවු. 35- 55 අතර නැවතී සිටීමට වැටුප රු. 25,000/- 071-9999563. L362347-1

කටුනායක (ආඩිඅම්බලම) වැදගත් පවුලක නිවසේ නැවතී වැඩ කිරීමට කැමති මැදිවියේ නීරෝගී කාන්තාවක් අවශ්‍යයි. 0772928275 L366364-1

කඩවත කුඩා පවුලකට ගෙදර නැවතී වැඩපල කිරීමට සුදුසු මැදිවියේ කාන්තාවක් සොයනු ලැබේ. වැටුප සාකච්ඡා කරගත හැක. 0759111110, 0727614733. L362128-1

කඩවත ගනේමුල්ල ප්‍රදේශයේ නිවසක නැවතී වැඩ කටයුතු කිරීම සඳහා (ඉවුම් පිහුම්/ නිවස පිරිසිදු කිරීම් ඇතුළුව) කාන්තාවක් අවශ්‍යයි. වයස 30-45 අතර. විමසීම් 0778379988 L362152-1

කඩවත නිවසක ඉවුම් පිහුම් සහ ගෙදර කටයුතු කිරීමට වයස අවුරුදු 50 ට වැඩි නිරෝගී කාන්තාවක අවශ්‍යයි. මාස 2 ක් වත් එක දිගට නැවතී සිටිය හැකි නම් පමණක් අමතන්න. 0718345655. L362743-1

කඩවත නිවසක නැවතී වැඩ කිරීමට වයස අවු. 50ට වැඩි කාන්තාවක් සොයයි. 0773336864, 0721722711. L361642-1

කඩවත නිවසේ නැවතී සේවය කිරීමට කාන්තාවක් අවශ්‍යයි. 0776260632, 0773400985 L367063-1

කඩවත පිහිටි නිවසක සේවයට අවු. 40ට වැඩි කාන්තාවක් අවශ්‍යයි. වැටුප් සාකච්ඡා කරගත හැක. 0767229725, 0112403083 L367074-1

කඩවත වැලිපිල්ලෑව නිවසක නැවතී සේවය කිරීමට ගෘහසේවිකාවක් අවශ්‍යයි. (40-50) අතර වැටුප 18000/-. විමසන්න 077-7401585, 011-2979008. L364576-1

කඩවත සූරියපාළුව නිවසක අවු. 02ක කුඩා දරුවකු බලා ගැනීමට අවුරුදු 50ට අඩු කාරුණික කාන්තාවක් අවශ්‍යයි. 071-7373743 L366858-1

කඩුවෙල අවු. 2 1/2ක බබෙක් සමඟ 4 දෙනෙක් සිටින පවුලකට කෑම පිසීමට, පිරිසිදු කිරීමට අවුරුදු 45ත් 55ත් අතර නිරෝගී කඩිසර පවුල් බරින් තොර දිගු කාලයක් නැවතී සිටිය හැකි ගැහැනු කෙනෙක් අවශ්‍යයි. වැටුප රු. 25,000/- L359673-1

කඩුවෙල නිවසේ නැවතී සේවය කිරීමට අවුරුදු 30-55ත් අතර කාන්තාවක් අවශ්‍යයි. වැටුප සාකච්ඡා කරගත හැක. 0704941794 L361977-1

කඩුවෙල, කොරතොට අවුරුදු 2ක් වයසැති දියණියක් රැක බලාගැනීමට කරුණාවන්ත අයෙක් සොයයි. උදය පැමිණ සවස ගිය හැක. දු.ක. 0712536946 වැටුප සාකච්ඡා කරගත හැක. L361988-1

කරාපිටිය රෝහල අසල නිවසක අවු. 1 දරුවකු බලා ගැනීමට අවු. 55 අඩු නිරෝගී කාන්තාවක් අවශ්‍යයි. 20,000/- 0717643093 L366972-1

කළුතර උතුර නිවසක අවු. 1 1/2 බබෙකු බලා ගැනීමට කළුතර උතුර අවටින් ගෘහ සේවිකාවක් අවශ්‍ය කර තිබේ. දු අංකය. 0777172427, 0765611721 L365956-1

කළුතර තිදෙනකු සිටින නිවසක නතරවී සේවයට කාන්තාවක් අවශ්‍යයි. වැටුප 20000-25000. 0707565758, 0707085427 L365785-1

කළුතර නිවසේ නැවතී වැඩ කළ හැකි අවුරුදු 25-60 අතර කාන්තාවක් අවශ්‍යකර තිබේ. වැටුප සාකච්ඡා කළ හැක. 0740200433 L364232-1

කළුතර මාස 6 ගැහැණු දරුවකු බලාගැනීමට කරුණාවන්ත කාන්තාවක් අවශ්‍යයි. රු. 25000/- වැඩකටයුතු සඳහා සහයක කාන්තාවක් ඇත. 0773512532 L359895-1

කැලණිය- දෙමහල් නිවසකට වයස 30-50 අතර ගෘහ සේවකයන් (කාන්තාවන්) සොයයි. කුඩා ළමුන් නැත. වැඩිහිටියන් 3ක් පමණි. විමසීම්. 0706664422. L363899-1

කැස්බෑව නතරවී රෝගී මවක බලාගැනීමින් නිවසේ වැඩට 55 ට අඩු නිරෝගී කාන්තාවක් සොයයි. 33000/- 0740442633, 0766676129. L363778-1

කැළණිය නිර්මාංශි නිවසක නැවතී සිට ආහාර පිසීම ඇතුළු වැඩවලට අවුරුදු 40-60 අතර කාන්තාවක් අවශ්‍යයි. 0723376200. L362490-1

කෑගල්ල නගර සීමාවේ නිවසක නැවතී සේවය කිරීමට කාන්තාවක් අවශ්‍යයි. 0776520956, 0702881685 L363605-1

කෑගල්ලේ නිවසක ගෙවත්ත පිරිසිදු කරමින් නැවතී සිටීමට මතින් තොර අවු. 55-65 අතර පිරිමි කෙනෙක් අවශ්‍යයි. වැටුප 20000/-. 0740090246, 0352241844. L363201-1

කෑගල්ලේ පිහිටි අප නිවසේ දියණියත් සමග නැවතී ගෙදර වැඩ කිරීමට කාන්තාවක් සොයමි. වැටුප සාකච්ඡා කර ගැනීමට අමතන්න. 0703812409 L362383-1

කෑගල්ලේ පිහිටි නිවසකට ගෘහ සේවිකාවක් අවශ්‍යයි. 0761538701. L366625-1

කිරිබත්ගොඩ අවට නිවසක නැවතී ඉවුම් පිහුම් කටයුතු කිරීමට කාන්තාවක් අවශ්‍යයි. 0767009626, 0772337392 L367172-1

කිරිබත්ගොඩ ඉංජිනේරු මහතකුගේ නිවසේ නැවතී ගේ දෙර වැඩ කිරීමට වයස අවු. 50 ට අඩු කාන්තාවක් සොයයි. බිරිඳ ගෙදර සිටින අතර කුඩා දරුවන් දෙදෙනෙකු සිටී. රු. 30,000 L364214-1

කිරිබත්ගොඩ කඩවත නිවසක කුඩා දරුවෙකු බලාගැනීමට පලපුරුදු සේවිකාවක් සොයයි. 0766966496. L362594-1

කිරිබත්ගොඩ රැකිවල නියුතු යුවලකගේ නිවසක නැවතී ඉවීමට හා පිරිසිදු කිරීමේ කටයුතු කිරීමට අවුරුදු 40-60 අතර නිරෝගී කරුණාවන්ත ආගමට ලැදි කඩිසර කාන්තාවක් අවශ්‍යයි. 0772647794 L363870-1

කිරිබත්ගොඩ විධායක ශ්‍රේණියේ රැකියාවැති යුවළකගේ නිවසෙහි කටයුතු හා ළමුන් බලා ගැනීමට නිවසෙහි නැවතී හෝ උදේ සවස ආ ගිය හැකි වයස අවුරුදු 50ට අඩු කාන්තාවක් අවශ්‍යයි. අමතන්න 0772346036 L362056-1

කිරිබත්ගොඩ, මාකොළ ප්‍රදේශයේ වයස අවුරුදු දෙකක ළමයෙක් බලාගැනීම සඳහා වයස අවුරුදු 40-50ත් අතර වයසේ කාන්තාවක් සොයයි. 0714795535, 0765768671, 0764855505 L367498-1

කිරිබත්ගොඩට නුදුරු රෝද පුටුවේ සිටිනා මව නිවසේ නැවතී බලාගැනීම සඳහා නිරෝගී කාන්තාවක් අවශ්‍යයි. වැටුප සාකච්ඡා කරගත හැකිය. 0779153635, 0755587028 L367330-1

කුඩා දියණියක් බලමින් ගෙදර දෙර වැඩ කිරීමට දක්ෂ කාන්තාවක් අවශ්‍යයි. (නැවතීමට හෝ) මාකොළ - කිරිබත්ගොඩ. 0718062272, 0773538911. L362554-1

කුඩා බොදු පවුලක ආහාර පිසීමටත් පිරිසිදු කිරීමටත් භාවනා කරන නිරෝගී පවුල්බර නැති 60ක කාන්තාවක් ග්‍රාමසේවා සහතිකය හැඳුනුම්පත හා කොරෝනා එන්නත් සහතිකය සමඟ පිටිසර පලාතකින් පැමිණෙන්න සබරගමු පළාත විශේෂයි. 27000/- 0112843254. L361631-1

කුරුණෑගල නගරාසන්නයේ නිවසක නැවතී සේවය කිරීමට ගෘහ සේවිකාවක් අවශ්‍ය වේ. සියළු පහසුකම් සමඟ ආකර්ෂණීය වැටුප්. 0718197668. L361144-1

කුරුණෑගල නිවසක නැවතී සේවය කිරීමට අවුරුදු 60ට අඩු නිරෝගී කාන්තාවක් අවශ්‍යයි. වැටුප රු. 30,000 + ගමන් වියදම්, බෙහෙත්හේත් සඳහා වියදම්. 0714198347 L362107-1

කුරුණෑගල නිවසකට 55 අඩු නැවතී වැඩ කිරීමට කාන්තාවක් අවශ්‍යයි. වැටුප 30000/- 0770747391, 0716227710 L367014-1

කුරුණෑගල නිවසකට ගේ, දෙර කටයුතු සඳහා පලපුරුද්ද ඇති වයස අවුරුදු 55ට අඩු කාන්තාවක් නැවතී සේවය කිරීමට සොයමි. වැටුප රු. 26,000/- 071-8929009 L364191-1

කුරුණෑගල බරන්දන ප්‍රදේශයේ නිවසක නතර වී කුඩා බබෙකු බලාගැනීමට වයස අවු 50 නොවැඩි ගැහැණු කෙනෙකු අවශ්‍යයි. 077-8747768, 0719550802 L364065-1

කුරුණෑගල ව්‍යාපාරික යුවලකට වයස 50 අඩු ගෘහසේවිකාවක් අවශ්‍යයි. TV සමඟ වෙනම කාමරයක් පඩිය. 30000/- 0773522260 L361130-

කුරුණෑගල විශ්‍රාමික නීරෝගී අප දෙදෙනාට අත්උදව්වම බාහිර කරදර අඩු 50ට අඩු අයෙක් ඉහළ පහසුකම්. 0718003942 L360332-

කුරුණෑගල වෛද්‍යවරයකුගේ නිවසක නැවතී වැඩකිරීමට වයස 40-60 අතර කාන්තාවක් අවශ්‍යයි 0772345231, 0703345231. L360447-1

කුරුණෑගල සුපර්ලයින් ආයතනයෙන් ගෘහසේවිකාවන්ට වතු පවුල්වලට රැකියා. වැටුප රු. 30,000/- සිට විමසීම් 0714150678, 0770150101 L360544-1

කොච්චිකඩේ පිහිටි නිවසක අවුරුදු දෙකක කුඩා දරුවෙකු බලා ගැනීමට හා ගෙදර දෙර වැඩ කටයුතු කිරීම සඳහා කාන්තාවක් අවශ්‍යවී ඇත. නිවසේ නැවතී වැඩ කටයුතු කළ යුතුය. අමතන්න. 0710666181 L367114-1

කොට්ටාව - ඉවුම් පිහුම්, ගෙදර වැඩ කළ හැකි (අවුරුදු 1 1/2ක දරුවකු රැක බලාගැනීමද ඇතුළත්ව - කෑම කැවීම, නෑවීම මව විසින් සිදු කරනු ලැබේ.) නිවසේ රැඳී සිට වැඩ කිරීම සඳහා විශේෂයි. වැටුප රු 35,000/- වයස අවුරුදු 40-50 අතර. 0771691436 L361939-

කොට්ටාව නිවසක නැවතී සේවය කිරීමට කාන්තාවක් අවශ්‍යයි වැටුප රු. 30,000/-. සියලු පහසුකම් සහිතයි. 0774538255 අමතන්න. L366140-

කොට්ටාව, පන්පිටිය ප්‍රදේශයේ නිවසක අවුරුදු 3ක් වයසැති දරුවෙකු බලාගැනීම සඳහා වයස අවුරුදු 30-50ත් අතර කාන්තාවක් අවශ්‍යයි. විමසීම් - 0714066906. L361304-1

කොට්ටාවේ වෛද්‍යවරයකුගේ නිවසකට නිරෝගී විශ්වාසවන්ත කාර්යශූර ගෘහසේවිකාවක් අවශ්‍යයි සාධාරණ ඉහළ වැටුප්. 0714471066 L365391-

කොහුවල නිවසක නැවතී සිට ඉවීම් ඇතුලු අනිකුත් ගෙදර වැඩට ගැහැණු අයෙක් අවශ්‍යයි. ආහාර පිසීමට දක්ෂ විය යුතුයි. කෝවිඩ් හේතුවෙන් නිවාඩු මාස 4ට වරක් පමණි. රු. 45,000/- Tel 0776240002. L361168-

කොළඹ 05 පිහිටි අමාත්‍යංශ ලේකම් මහතකුගේ නිවසේ නැවතී සේවය කළ හැකි ගෘහ සේවිකාවක් අවශ්‍යයි. පවුලේ 4 දෙනකුගේ ඉවුම් පිහුම් වැඩ, නිවස සුද්ද පවිත්‍ර කිරීමේ හැකියාව. වයස 45-60 විය යුතුය. විශ්වාසවන්ත කාර්යක්ෂම නිරෝගී අයකු අවශ්‍යයි. වැටුප රු 35,000/- ආහාර පාන, නවාතැන් නොමිලේ. 0765496309 0772555586. L361019-

කොළඹ ගෙදරක නැවතී කෑම පිසීමට පිරිසිදු කිරීමට කඩිසර ගැහැණු කෙනෙක් අවශ්‍යයි. 30,000/- 0778813928. L361363-

කොළඹ තරුණ යුවලකට (වයස 30-55) අතර කාරුණික කාන්තාවක් සාමාන්‍ය ගෙදර දෙර කටයුතුවලට අවශ්‍යයි. පවුලේ කෙනෙකු මෙන් පහසුකම් සහිතයි. 35000/- 0710910785, 0771235325 L366354-

කොළඹ නුගේගොඩ නිවසකට නැවතීමට ගෘහසේවිකාවක් අවශ්‍යයි වැටුප 35000/-. 0718329305 128/2, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ. L360085-

කොළඹ ප්‍රදේශයේ පදිංචි වෛද්‍යවරියක් වන මා සමඟ මාගේ තනිනොතනියට නැවතී සිටීමට හා තනි තට්ටුවේ වැඩ කටයුතු කර නැවතී තමන්ගේම කෙනෙකු මෙන් විශ්වාසවන්තව සිටීමට අවුරුදු 60 ඇතුළු කාරුණික කාන්තාවක් ඉක්මණින් අවශ්‍යයි. වැටුප 35,000/- වෛද්‍ය අනෝමා 0715804743. L364523-

කොළඹ බංගලාවක ආහාර පිසීමට නිවස පිරිසිදු කිරීමට, නැවතී සේවයට, සේවිකාවන් අවශ්‍යයි. වැටුප 30000/- සිට. 0765427730. L364688-1

කොළඹ බම්බලපිටිය නිවසකට නැවතී වැඩකළ හැකි අවුරුදු 55 අඩු කාන්තාවක් අවශ්‍යයි. සියළුම පහසුකම් සහිතයි. 0777277972. L363080-1

11 වැනි පිටුවට...

කොළඹ හෝකන්දර නිවසක නැවතී සේවයට, හොඳින් ඉවීමට හා පිරිසිදු කිරීමට හැකි වයස 60ට අඩු, නිරෝගී කාන්තාවක් අවශ්‍යයි. හොඳ වැටුප්, පහසුකම් සමඟ ආරක්ෂිත පරිසරයක. 0777-939012 L361717-1

කොළඹ හෝමාගම නිවසේ නතර වී වැඩට නිරෝගී කාන්තාවක් අවශ්‍යයි. වැටුප කතා කළ හැක. 0777 215518, 077 3046134, 0712 802890 කුඩා පවුලකි. L367345-1

කොළඹට ආසන්න නිවසක නැවතී සේවය කිරීමට පවුල් බරින් තොර කාන්තාවක් අවශ්‍යයි. වැටුප සාකච්ඡා කරමු. 0382-290412 L362083-1

කෝවිටේ ප්‍රදේශයේ නිවසක නැවතී සේවය කිරීමට වයස අවු. 40 පමණ කාන්තාවක් අවශ්‍යයි. වැටුප රු. 40,000/-. දු.ක. 0777811811. L360899-1

හම්පහ උසස් නිලධාරි මහතෙකුගේ නිවසේ නැවතී සේවය සඳහා අවුරුදු 50ට අඩු සේවිකාවක් අවශ්‍යයි. වැටුප. 30,000/- 0716607552. L1021620905-1

හම්පහ නිවසක නැවතී ඉවුම් පිහුම් කටයුතු කිරීමට නිදහස් කාරුණික කාන්තාවක් අවශ්‍යයි. 071-8484838 L1021621194-1

හම්පහ නිවසක නැවතී සේවය කිරීම සඳහා කාන්තාවක් අවශ්‍යයි. වැටුප 30000/- 0778400689. L1021621221-1

හම්පහ නිවසකට කරුණාවන්ත අවු. 40 - 55 අතර ළමුන් බලාගැනීමට නැවතී සිටීමට සේවිකාවක් සොයයි. රු. 25000/-. 0713900755. L363893-1

හම්පහ ප්‍රදේශයේ අපගේ නිවසේ නැවතී ඉවුම් පිහුම් සහ පිරිසිදු කිරීම් සඳහා වයස අවුරුදු 55ට අඩු කාන්තාවක් අවශ්‍යයි. වැටුප් සාකච්ඡා කරගත හැක. දු.ක. 0777788836 L1021621596-1

හම්පොල නිවසක නැවතී සේවය කිරීමට හැකි විශ්වාසවන්ත සේවිකාවක් අවශ්‍යයි. අවු. 3 දරුවකු බලාගැනීමට හා ආහාර පිසීම පමණක් අපේක්ෂා කෙරේ. වැටුප සාකච්ඡා කරගත හැක. 0702273623 L364722-1

හල්කිස්සේ ගෙදරක වැඩට උයන්න පුළුවන් මැදිවයස් පිරිමි කෙනෙක් නේවාසිකව සිටීමට සොයයි. අමතන්න. 0772076465 L364779-1

හල්කිස්සේ, ගෙදර වැඩට කාන්තාවක් අවශ්‍යයි. වැටුප් සාකච්ඡා කළ හැක. 0773242519 L362524-1

හල්ගමුව වෛද්‍යවරියකගේ නිවසේ නැවතී අවුරුද්දක දරුවකු බලාගන්නිමින් නිවසේ වැඩට උදව්වීමට කාරුණික කාන්තාවක් අවශ්‍යයි. වැටුප 28,000. 0777-684240 L363832-1

හල්ගමුවේ නිවසක ඉවුම් පිහිමු ආදී ගේදර වැඩ නැවතී සිට කිරීමට නිරෝගීමත් කාන්තාවක අවශ්‍යයි. වැටුප 30,000/- 0766434993. L363852-1

හාල්ල කරාපිටිය වෛද්‍යවරයකගේ නිවසේ නැවතී සේවය කළ හැකි අවුරුදු 35-55 අතර ගෘහ සේවිකාවක් අවශ්‍යයි. වැටුප රු. 25000, 0716326668. L1021620973-1

හාල්ල දෙස්තර මහත්මියකගේ නිවසේ නැවතී වැඩ කිරීමට බාහිර කරදර නැති කෑම පිසීමට දන්නා සේවිකාවක් අවශ්‍යයි. රු. 30,000/- 0777349513. L1021620988-1

හාල්ල නිවසක නැවතී සේවය කිරීමට නීරෝගී ශක්තිමත් වයස 50ට අඩු කාන්තාවක් අවශ්‍යයි. වැටුප 27000/- 0718187062 L367035-1

හාල්ල වඳුරඹ ප්‍රදේශයේ වයසක කාන්තාවක් බලාගෙන කෑම සෑදීම සඳහා අවුරුදු 45-55 අතර මනා සෞඛ්‍යය තත්වයෙන් යුත් ගාල්ල ප්‍රදේශයෙන් සොයයි. 0702571830 L1021621402-1

හාල්ල වෛද්‍යවරයෙකුගේ නිවසේ නැවතී කෑම පිසීමට දන්නා විශ්වාසවන්ත අයෙකු අවශ්‍යයි. 0777719389. L361133-1

හාල්ල වෛද්‍යවරුන් දෙපලකගේ දෙමව්පියන් සමග දීර්ඝ කාලීනව ඉවුම් පිහුම් කටයුතු හොඳින් දන්නා පවුන් බරින් තොර අවු. 25-40 අතර ගෘහ සේවිකාවක් අවශ්‍යයි. 0770849892, 0727585951 L365460-1

හාල්ලේ තිදෙනෙක් පමණක් සිටින අපගේ නිවසේ ගේ දොර වැඩපළ කිරීමට නිරෝගීමත් වයස අවුරුදු 50-60 අතර විශ්වාසවන්ත සේවිකාවක් අවශ්‍යයි. වැටුප රු. 30000/- විමසීම්. 077-3555237. L361146-1

ගාල්ලේ සදරන් ඒජන්සියෙන් ගෘහසේවිකාවන්ට පිරිමින්ට වැදගත් නිවාසයන්හි රැකියා. වසර 15 විශ්වාසය. ගම්බද සේවාකාවන් ලබා ගැනීමට දිවයිනෙන්ම විමසන්න. රේඩා මීස්. 0771983868 L1021621340-1

ගිරිඋල්ල ආසන්නයේ නිවසක් සඳහා කරුණාවන්ත කාන්තාවක් අවශ්‍යයි. 0779519759 L364105-1

ගෘහ සේවය ගැහැණු / පිරිමි (අවුරුදු 30-55 අතර) හොරණ අවට විශේෂයි. නවාතැන් පහසුකම් ද ඇත. ඉහළ වැටුප් හා දීමනා. 077-3439294 L365482-1

ගෘහ සේවිකා (ව්ව්ඩ) අවු. 45 වැඩි කාන්තාවක් පිරිසිදු කිරීම සඳහා අවශ්‍යයි. වැටුප රු. 24000/- + O.T. හිමිවේ. පෙසින්කෝ සමාගම - හංවැල්ල 0764419333, 0771076241. L361946-1

ගෘහ සේවිකාවක් අවශ්‍යයි. 145, පරණ කොට්ටාව පාර, මිරිහාන, නුගේගොඩ. 0712228274 L362807-1

ගෘහ සේවිකාවක් අවශ්‍යයි. පඩිය 30000/- කරුණාවන්තව සලකමි. සියළු පහසුකම් ඇත. මිරිහාන, නුගේගොඩ. 0774246857 L364287-1

ගෘහ සේවිකාවක් අවශ්‍යයි. වැටුප් 32,000/- නිවසේ නැවතී වැඩ කළ හැකි පළපුරුදු අය කිරිබත්ගොඩ වෛද්‍ය ආහාරපාන නොමිලේ. 0773735241 L367328-1

ගෘහසේවිකාවක් මහරගම නිවසක නැවතී වැඩ කිරීමට අවු. 55 ට අඩු. සියළුම පහසුකම් සහිතයි. වැටුප 30,000/-යි. (කුඩා පවුලකට). 0772292283. L367879-1

ගෙදර දොර වැඩ සඳහා කාන්තාවක් අවශ්‍යයි. නවාතැන් සහ කෑම බීම පහසුකම් ඇත. 0771979480 L365222-1

ගෙදර නැවතී කෑමපිස ගේ දොර පිරිසිදුව තබාගත හැකි තලත්තෑනි පළපුරුදු කෝකියෙකු උවමනාය. 0773635912, 0777427513. L359803-1

ගෙදරක උයන පිහන වැඩට (විශේෂයෙන්ම) පවුල් බරින්/ සුරා සුදුවෙන් තොර පිරිමි අයකු අවශ්‍යයි. ගල්කිස්ස. 0777918882 L362842-1

ගෙදරක නතරවී වැඩ කිරීමට, නිරෝගී පවුල් බරින් තොර අවුරුදු 45-55 අතර කාන්තාවක් අවශ්‍යව ඇත. 071-1003333 L361615-1

ජාඇල නිවසක නැවතී සේවය කිරීමට කාන්තාවක් අවශ්‍යයි. විමසන්න. 0702567043. L361827-1

ජාඇල, බොල්ලත නිවසක සේවයට පළපුරුදු කාන්තාවක් අවශ්‍යයි. නතර වී සිටීමට විශේෂයි. 0768436749, 0773041786. L360183-1

තංගල්ල ප්‍රදේශයේ පිහිටි නිවසක නැවතී සේවය කිරීමට කාන්තාවක් අවශ්‍යයි. දුරකථන අංකය - 0760997778. L363352-1

තඹුත්තේගම නිවසක නැවතී සේවයට දක්ෂ, ක්‍රියාශීලී වයස 55ට අඩු කාන්තාවක් අවශ්‍යයි. වැටුප සාකච්ඡා කරගත හැක. 0712005685, 0760 802309. L367265-1

තරුණ යුවලකගේ නිවසේ වැඩ සඳහා නැවතී වැඩ කළ හැකි කාන්තාවක් වහාම අවශ්‍යයි. ආකර්ෂණීය වැටුප්. ඒ.ජී. සේනාධීර (පුද්) සමාගම, නො. 405, පරණ කොට්ටාව පාර, උඩහමුල්ල, නුගේගොඩ. දු.ක.:- 0768288163, 0759500444 L364011-1

තලවතුගොඩ දෙදෙනෙක් පමණක් සිටින නව නිවසකට කෑම පිසීමට පළපුරුදු හා සුද්ධ පවිත්‍ර කටයුතු කිරීමට හැකි ගැහැනු අයෙක් අවශ්‍යයි. වයස අවුරුදු 60ට අඩු නැවතී සිටීමට කැමැති අය පමණක් විමසන්න. වැටුප මසකට 35,000.00 0773779865 L367970-1

තිදෙනෙකු සිටින නිවසක කෑම පිසීමටත් අවශ්‍ය වූ විට ගේදර බලා ගැනීමටත් හැකි වයස අවු. 60 අඩු පළපුරුදු පිරිමි අයෙක් අවශ්‍යව ඇත. 0775-257718 පුරකතනය අමතන්න. L362073-1

තිස්සමහාරාමයේ සංවාරක බංගලාවක ඉවුම් පිහුම් කටයුතු කිරීමට සහ ගෙවත්ත බලාගැනීමට හැකි මැදි වයසේ යුවලක් අවශ්‍යයි. අමතන්න. 0752748127. L361612-1

දංකොටුවට නුදුරු අපගේ නිවසේ ගේදොර අත් උදව්වට ගැහැණු කෙනෙකු අවශ්‍යයි. කෑම බීම, ඉඳුම් හිටුම් සමග වැටුප රු. 30,000 0772265657 L361951-1

දකුණු පළාතේ වතුයායක නිවසක අවු. 3 පමණ බබෙක් බලාගැනීමට අවු. 30-45 පමණ ප්‍රියමනාප සේවිකාවක් වහාම අවශ්‍ය වේ. තමන්ට ස්ථිර නිවහනක් නැති අය විශේෂිත වේ. අමතන්න. 077 3883125, 0715927662. L367261-1

දකුණේ නිදහස්ව සිටින විශ්‍රාමකයෙකුගේ සහයට අවු. 60 සුරා නැති නිදහස් අයෙකු/ යුවලක් උවමනාය. සුදුස්සන්ට ප්‍රතිලාබ රැසක්. 0704835604 L1021621041-1

දන්කොටුවේ නිවසක නැවතී වයස අවුරුදු 1යි මාස 3ක දරුවකු බලා ගැනීමට කාන්තාවක් අවශ්‍යයි. විමසීම:- 0718538481 L365744-1

දෙදෙනෙක් සිටින නිවසට උදව්වට අවු 45-55 අතර කාරුණික අම්මා කෙනෙකු අවශ්‍යයි. වැටුප 20.000. 0711871159. L362569-1

දෙදෙනෙකු පමණක් සිටින කුඩා නිවසක නැවතී ඉවුම්පිහුම් කිරීමට බාහිර කරදරවලින් තොර අවු. 55ට අඩු කාන්තාවක් අවශ්‍යයි. 0718566788 L364957-1

දෙදෙනෙකු සිටින කොට්ටාව නවීන නිවසක නැවතී සුළු වැඩට 35ට අඩු පවුල් බරින් තොර ගෘහ සේවිකාවක් අවශ්‍යයි. මාසිකව 20,000 සියලුම පහසුකම් සහිතයි. 0773297252 L367116-1

නාරාහේන්පිට අවටින් කුඩා දරුවෙකු බලා ගැනීමට පළපුරුදු ඇති කාන්තාවක් අවශ්‍යයි. 0773205997. L361816-1

නාවින්න (මහරගම) නිවසක නැවතී හෝ දිනපතා පැමිණ ආහාර පිසීම ඇතුළු දෛනික වැඩකටයුතු කිරීමට කාන්තාවක් අවශ්‍යයි. විමසීම් (නිවස) 0755841000 L361299-1

නැවතී සේවයට ගෘහසේවිකාවක් අවශ්‍යයි. කොළඹ-5 නැවතී වැඩ කිරීමට හැකි ගෘහසේවිකාවක් අවශ්‍ය කෙරේ (වයස 30-55). මූලික ඉවුම් පිහුම් වැඩ සහ පිරිසිදු කිරීම් වැඩ රාජකාරි වේ. වැටුප මසකට රු. 35,000/- අමතන්න 0766946575 L361814-1

නිට්ටඹුව නිවසක නතරවී වසරක දරුවා බලාගනිමින් නිවසේ වැඩට උදව් කිරීමට කාරුණික කාන්තාවක් අවශ්‍යයි. වැටුප සාකච්ඡා කරගත හැක. අමතන්න: 0773448162, 0777417750 L364727-1

නිට්ටඹුව නිවසක සේවය කිරීමට කාන්තාවක් අවශ්‍යයයි. අමතන්න 0714698494, 0332291250. L363120-1

නිට්ටඹුවේ නිවසක ඉවුම් පිහුම් සහ ගෙදරදොර වැඩකටයුතු සඳහා නැවතී වැඩකල හැකි ගෘහණු/ පිරිමි අයෙකු අවශ්‍යයි. වැටුප 30,000/- 0770121050 L365042-1

නිවසක ඉවුම් පිහුම් කටයුතු සහ පිරිසිදු කර ගැනීමට නැවතී සේවය කල හැකි කාන්තාවක් අවශ්‍යයි. වැටුප රු. 30,000/-. 0776659946. L364460-1

නිවසක නැවතී අවුරුදු දෙකක් වයසැති දරුවෙක් බලාගැනීමට 45ට අඩු කාන්තාවක් උවමනායි. නො. 28, හරස් පාර, බොරැල්ල. 0717268835 L360711-1

නිවසක නැවතී සේවය කිරීම සඳහා කරුණාවන්ත කාන්තාවක් වයස (50 - 60) අතර අවශ්‍යයි. වැටුප රු. 24000/-. අවිස්සාවේල්ල පාර, රණාල. දුරකථන 0714420801. L362664-1

නිවසක පිහිටි කුඩා වැඩපලක් බලාගැනීමට අවු. 30-45 අතර ගැහැණු කෙනෙකු අවශ්‍යයි. දරුවකු නවාතාගෙන වැඩකළ හැක. 0715505998 L367532-1

නිවසක වැඩ කිරීමට ගැහැණු සේවිකාවක් අවශ්‍යයි කිරිබත්ගොඩ 077-9996113, 071-0539940 L367562-1

නිවසක සේවය කිරීම සඳහා කාන්තාවක් අවශ්‍යයි. නැවතී සේවය කිරීමට හෝ උදේ සවස පැමිණීමට ගම්පහ අවටින් විශේෂයි. අමතන්න 0718075091 L364858-1

නිවසෙහි නැවතී වැඩ කිරීමට අවු. 60ට අඩු කාන්තාවක් අවශ්‍යයි. රු. 20,000/- ගම්පහ. 077-6097649. L1021621224-1

නිවසේ නැවතී මව බලාගැනීමට අවුරුදු 58ට වැඩි නිරෝගී කාන්තාවක් වහා අවශ්‍යයි. 0717286669. L366635-1

නිවසේ හා වත්තේ වදිනෙද කටයුතු අප සමග කරගෙන යාමට නිරෝගි 55 පෝඩුවක් අවශ්‍යයි. ආහාර වෙනත් පහසුකම් ලබාදී දෙදෙනාටම එකතුව 30,000/- 0332291857, 0741339400 L364990-1

නිවසේ වැඩට ගෘහ සේවිකාවක් අවශ්‍යයි. නුවර/ පොළොන්නරුව විමසන්න. 0770-300805 L361903-1

නුගේගොඩ ගෙදරක නැවතී නිරෝගී මවක් බලා ගැනීමට හා කෑම පිසීමට හැකි කාන්තාවක් සඳහා වැටුප 25,000/- Contact 0773591852 L366874-1

නුගේගොඩ ගෙදරකට පිරිසිදුවට රසට සිංහල ක්‍රමයට කෑම සෑදීමට දක්ෂ අවු. 40-50 නිරෝගීමත් කාන්තාවක් නැවතී වැඩ කිරීමට අවශ්‍යයි. මාස තුනකට වරක් නිවාඩු වැටුප 35000/-. 243, මාදිවෙල පාර, උඩහමුල්ල, නුගේගොඩ. 0777376410, 0773429154 L363742-1

නුගේගොඩ තිදෙනෙක් සිටින පවුලකට කෑම පිසීමට පිරිසිදු කිරීමට හැටට අඩු අවංක නිරෝගීමත් සේවිකාවක්. ග්‍රාම නිලධාරි සහතිකයත් සමග. රු. 27000/-. 0702041420, 0112769753. L360817-1

නුගේගොඩ නාවල නිවසක නැවතී සේවය කිරීමට බාහිර කරදරවලින් තොර නිහතමානී කාන්තාවක් අවශ්‍යයි. 0771104665 L367416-1

නුගේගොඩ නිවසකට නැවතී සිටින ගෘහසේවිකාවක් වහාම අවශ්‍යයි. වයස 50-60 අතර වැටුප 40,000යි. 0772819425. L363196-1

නුගේගොඩ පවුලක, නිවසේ වැඩට කානතාවක් අවශ්‍යයි. නැවතී සිටිය හැකි අවුරුදු 35-50 අතර විය යුතුය. වැටුප මසකට 33,000-35,000/- අතර. අමතන්න. 0769733838. L364237-1

නුගේගොඩ පිහිටි පාසලකට පිරිසිදු කිරීමේ සේවක/ සේවිකාවන් වහාම අවශ්‍යයි. අමතන්න 0768810012. L360883-1

නුගේගොඩ වෛද්‍යවරියකගේ නිවසේ අවු. 2 ළමයෙකු බලා ගැනීමට අයෙකු සහ කෑම පිසීමට අයෙකු අවශ්‍යයි. 0776085808. L361135-1

නුවර බංගලාවක නැවතී සේවය කිරීමට යුවලක් අවශ්‍යයි. 0772224315, 0772681490 L366784-1

පන්නිපිටිය - ඉවුම් පිහුම්, ගෙදර වැඩ කළ හැකි (අවුරුදු 6ක දරුවකුට කෑම කැවීම ගැනීමද ඇතුළත්ව) නිවසේ රැඳී සිට වැඩ කිරීම සඳහා විශේෂයි. වැටුප රු. 35,000/- වයස අවුරුදු 35-50 අතර. 0772454876 L361933-1

පන්නිපිටිය, මොරකැටියේ පිහිටි නිවසකට අවුරුදු තුනක දරුවෙකු බලා ගැනීමට ඉතා කාරුණික හා විශ්වාසවන්ත කාන්තාවක් සොයයි. 0703665171, 0774528138. L362463-1

පන්නිපිටියේ පිහිටි අප දෙමහල් නිවසේ ඉවුම් පිහුම් ගේදොර වැඩ කටයුතු සඳහා වයස 60ට අඩු දක්ෂ කඩිසර කාන්තාවක් අවශ්‍යයි. ආහාරපාන නවාතැන් පහසුකම් ඇත. වැටුප රු. 40,000 අමතන්න. 0770525297/ 0769670301 L367553-1

පාදුක්කේ නිවසේ නැවතී අසනීප මව බලාගැනීමට ඉවීමට කාන්තාවක් අවශ්‍යයි. 55ට අඩු. 0717537460. L364286-1

පානදුර නිවසක නැවතී සේවය සඳහා කාන්තාවක් අවශ්‍ය කර ඇත. වැඩිදුර විස්තර සඳහා විමසන්න. 0706920929 L362124-1

පානදුර නිවසක නැවතී සේවයට අවු. 55ට අඩු කාන්තාවක් අවශ්‍යයි. 0772936896, 0711957607. L366304-1

පානදුරේ නිවසකට නැවතී වැඩට අවු. 35-55 අතර සේවිකාවක් අවශ්‍යයි. 071-4842937 L366931-1

පැපිලියානේ නිවසක ඉවුම් පිහුම් කටයුතු සහ සුද්ද පවිත්‍ර කිරීමේ කටයුතු සඳහා අවංක සේවිකාවක් සොයමි. අමතන්න. 0777143223 L365745-1

පැලවත්ත, බත්තරමුල්ල පිහිටි නිවසකට, ඉවුම් පිහුම් පිළිබඳ පළපුරුදු ඇති, නේවාසිකව සේවය කිරීම සඳහා, අවුරුදු 30-50 ත් අතර ගෘහ සේවිකාවන් අවශ්‍ය වී තිබේ. අමතන්න. 0768417676. L364187-1

පිටකෝට්ටේ වෛද්‍ය ඉංජිනේරු යුවලකගේ දෙමහල් නිවසේ සේවයට, නැවතීමට කැමති මැදි වියේ කාන්තාවක් සොයයි. 0768206820 L360681-1

පිටකෝට්ටේ වෛද්‍යවරියකගේ තනි තට්ටුවේ නිවසේ නැවතී සේවයට විශ්වාසවන්ත සේවිකාවක් අවශ්‍යයයි. වැටුප 32,000/-. 0718428661, 0770719931 L362879-1

පිළියන්දල නිවසක නැවතී මාස 3ක දරුවෙක් බලාගැනීමට වයස 50-60 පමණ නිරෝගී කාන්තාවක් අවශ්‍යයි. තමාම අමතන්න. 0710929510 L362316-1

පොල්ගහවෙල නිවසක නැවතී සේවය කිරීමට 50 අඩු කාන්තාවක් අවශ්‍යයි. වැටුප සාකච්ඡා කර ගත හැක. 0777900950 L366944-1

පෞද්ගලික ආයතනයක කළමනාකාර අධ්‍යක්ෂවරයෙකුගේ නිවසේ ඉවුම් පිහුම් කටයුතු සඳහා කාන්තාවක් අවශ්‍ය වී ඇත. නුගේගොඩ අවට ප්‍රදේශයේ වීම විශේෂයි. විමසීම්: 071-3805959 L361222-1

බත්තරමුල්ල අධ්‍යක්ෂවරයෙකුගේ නිවසට මැදපෙරදිග සේවයකර ඇති අවුරුදු 35-45 අතර පිරිසිදු කිරීමට දක්ෂ කාන්තාවක් නැවතී සේවය කිරීමට වහාම අවශයයි. ආහාර පිසීමටද හැකිවිය යුතුයි. ඉහල වැටුප් 0704033200 L366584-1

බත්තරමුල්ල අප බංගලාවේ ඉවුම් පිහුම් කටයුතු සඳහා දක්ෂ මනා දැනුමක් ඇති නැවතී සේවය කළ හැකි අවු. 25-40 අතර කාන්තාවක් අවශ්‍යයි. වැටුප 40000-50000 අකුරේගොඩ, බත්තරමුල්ල. 0777422822 L365147-1

බත්තරමුල්ල අප මවගේ උපස්ථාන කටයුතු සඳහා අදළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති බුද්ධිමත් කරුණාවන්ත වයස 20-40 අතර කාන්තාවක් නැවතී සේවය කිරීමට අවශ්‍යයි. අකුරේගොඩ, බත්තරමුල්ල. 0777714884 L365159-1

බත්තරමුල්ල නිවසක නතර වී කුඩා දරුවෙකු (අවු.2ක) බලාගැනීම සඳහා අවු. 40-60 අතර කාන්තාවක් ඉතා ඉක්මණින් අවශ්‍යයි. වැටුප සාකච්ඡා කරගත හැක. 070-2461233, 077-7138007. L367286-1

බත්තරමුල්ල වැදගත් නිවසක නැවතී හැකි ගේදෙර පිරිසුදු කිරීමට වයස 30-45 කාන්තාවක් සොයමි වැටුප 25,000/- 30,000/- ආහාර, නවාතැන්, බේත්. 0777381940. L362748-1

බත්තරමුල්ලට නුදුරු නිවසකට කෑම පිසීමට සහ පිරිසුදු කිරීමට නැවතී සේවයට කාන්තාවක් අවශ්‍යයි. සියලු පහසුකම්වලින් යුතු කාමරයක් ඇත. වැටුප 30000/- 0712936401 L367463-1

බදුල්ල වෛද්‍යවරියකගේ නිවසේ කටයුතු සඳහා උදව්වට කාන්තාවක සොයයි. 077-2270953 L364950-1

බොරලැස්ගමුව 0776415799 නිවසේ නැවතී මාස 8ක ළමයකු බලා ගැනීමට පළපුරුදු නැනීවරයකු අවශ්‍යයි. 35,000/- L362116-1

බොරලැස්ගමුව ප්‍රදේශයේ නතර වී වැඩ කිරීමට - වයස අවුරුදු 50ට අඩු යුවලක් අවශ්‍ය කර තිබේ. ඉළුම් හිටුම් කෑමබීම සැපයෙන අතර මාස 02කට හෝ 03කට වරක් නිවාඩු යන පදනම මත දෙදෙනාටම මාසිකව රු. 50,000/- 60,000/-ක වැටුපක් ගෙවනු ඇත. ගාර්ඩින් එකක වැඩ කිරීමට සහ බල්ලන් තුන්දෙනෙකු බලා ගැනීම පිරිමි අයට පැවරෙන අතර අවුරුදු 4ක බබෙකු පෙරපාසල් රැගෙන යාම හා බබාගේ අනෙකුත් සියලු කටයුතු ගැහැණු අයට පැවරේ. 0773-615630 L366820-1

බොරලැස්ගමුව ප්‍රදේශයේ නිවසක නතරවී අවුරුදු 4ක බබෙකු බලාගැනීමට හා බබාගේ අනෙකුත් වැඩ කටයුතු කිරීමට හැකි පළපුරුදු, වයස අවුරුදු 45ට අඩු කාන්තාවක් අවශ්‍යයි. මාස 2කට 3කට වරක් නිවාඩු යන පදනම මත මසකට රු. 40,000/- වැටුපක් ලබාගත හැකිය. 077-9749955 L366843-1

බොරලැස්ගමුවේ නිවසකට නැවතී සේවයට නිරෝගී නිදහස් සේවිකාවක් අවශ්‍යයි. වැටුප සාකච්ඡා කරගත හැක. 0714443369, 0714495857. L363095-1

බොරැල්ල වෛද්‍ය යුවළකගේ නිවසක නැවතී සිට ඉවීමට හා පිරිසිදු කිරීමට වයස 30-55 ගෘහසේවිකාවක් අවශ්‍යයි. ආකර්ෂණීය වැටුපක්. 0718099056 L362355-1

බොරැල්ලේ නිවසක දරුවන් දෙදෙනෙක් (අවුරුදු 06, 04) බලාගැනීමට උදව්වට හා ආහාර පිළියෙල කරගැනීමට උදව්වට දුර පළාතකින් කාන්තාවක් අවශ්‍යයි. නතර වී සිටිය යුතුය. වැටුප 30000/- නිවාඩු දින 05යි. 077-2115036, 078-3906217, 072-9547680. L365971-1

බොරැල්ලේ වෛද්‍යවරයෙකුගේ නිවසේ නැවතී සිට ගේදෙර වැඩ කිරීමට මැදිවියේ කාන්තාවක් අවශ්‍යයි. 35000/- 0740-150413 L363728-1

භවනා මධ්‍යස්ථානයක 08 දෙනෙකුට ආහාර පිසීම සඳහා දක්ෂ කඩිසර නිරෝගී කාන්තාවක් වහාම අවශ්‍යයි. 0718064204, 0715310800 L367151-1

මඩිවෙල දෙමහල් නිවසකට දිනපතා කෑම පිසීමට පිරිසිදු කිරීමට වයස 50ට අඩු බාහිර කරදර වලින් තොර නිරෝගි කාන්තාවක් අවශ්‍යයි. දිනක වැටුප රු. 1300/- අමතන්න. Tel 0704124947. L364243-1

මව බලාගැනීමට හා ගෙදර වැඩට සේවිකාවක් අවශ්‍යයි. අවුරුදු 50 අඩු රු. 25000 සිට 40,000 දක්වා. 0702637758 L367426-1

මහනුවර - කටුගස්තොට නිවසක නැවැතී සේවය කිරීමට කාන්තාවක් අවශ්‍යයි. වැටුප රු. 30,000/- සිට. 0773050776 L363343-1

මහනුවර Kandy Royal ජාත්‍යන්තර පාසලේ සේවය කිරීම සඳහා පිරිසිදු කරන්නියන්, කාන්තා ආරක්ෂක නියාමිකාවන් අවශ්‍යයි. දුර බැහැර අයට නවාතැන් පහසුකම්. සම්මුඛ පරීක්ෂණ 17-11-2021 දින උදේ 10.00ට. වැව රවුම, මහනුවර. 0718812732 L363827-1

මහනුවර නිවසක නතර වී අවුරුදු 1ක දරුවන් දෙදෙනකු බලා ගැනීමට වයස අවුරුදු 60ට අඩු පළපුරුදු කාන්තාවන් දෙදෙනකු අවශ්‍ය වේ. 0766457261, 0717588728 L365068-1

මහනුවර නිවසක නැවතී සේවය කරමින් ආහාර පිසීමට සහ පිරිසිදු කිරීමට කාන්තාවක් අවශ්‍යයි. 0779850462 L364982-1

මහනුවර නිවසක නැවතී සේවය කිරීමට ඉතා හොඳින් කෑම ඉවීමට හැකි අවුරුදු 40-60ත් අතර කරුණාවන්ත කාන්තාවක් වහාම අවශ්‍යයි. 0761185276 L361529-1

මහනුවර නිවසකට ඉවුම් පිහුම් ඇතුළු සියළු වැඩදන්නා 40-55 අතර නිරෝගී කාන්තාවක් අවශ්‍යයයි. වැටුප 35,000/-. 0713880976 L362937-1

මහනුවර නිවසේ ඉවුම් පිහුම් කටයුතු කිරීමට සහ ගෙදර වැඩ කිරීමට ගැහැනු කෙනකු අවශ්‍යයි. 0783633910 L364709-1

මහනුවර නිවසේ නැවතී වැඩ කිරීමට කාරුණික කාන්තාවක් සොයන්නෙමු. කුඩා දරුවන් දෙදෙනෙක් ඇත. සරිලන වැටුප්. 0714455707, 0718626264. L362373-1

මහනුවර ප්‍රදේශයේ පදිංචි දෙදෙනකු පමණක් සිටින ව්‍යාපාරික පවුලකට ඉවුම් පිහුම් වැඩ සඳහා නැවතී සිටීමට අවුරුදු 45-55 අතර ගුණවත් කාන්තාවක් සොයමි. වැටුප රු. 35,000/- සිට. 0776842443, 0815663567 L360440-1

මහනුවර ප්‍රදේශයේ මහා පරිමාණයේ ව්‍යාපාරිකයෙක් වන මාගේ අසනීපකාරී මව බලා ගැනීමට අවංක කාන්තාවක් අවශ්‍ය කෙරේ. වයස 25-55. වැටුප 30-40 අතර වේ. අමතර උදව් උපකාර සමඟ මසකට නිවාඩු දින 4කි. 0717445829, 0815704904 L360530-1

මහනුවර රජයේ සේවයේ නියුතු පවුලක නිවසේ වැඩ කටයුතු කිරීමට කාන්තාවක් සොයයි. වයස අවු. 40-60. දහවල් 12න් පසුව අමතන්න. 0718-663548 L359311-1

මහනුවර වෛද්‍යවරියකුගේ අවුරුදු 17 වයසැති දියණිය පාසල් රැගෙන යාම සඳහා මහනුවර අවටින් කාන්තාවක් අවශ්‍යයි. 0727279789 L361713-1

මහරගම නිවසක නැවතී ගෘහසේවයට අවුරුදු 45ට වැඩි අවංක, කාරුණික කාන්තාවක් අමතන්න. 0777582832 L362038-1

මාතර නගරයේ ඉතා වැදගත් මහත්මයකුගේ වැඩවලට නතරවී සහය වීමට කරුණාවන්ත නිරෝගී පිරිමි අයකු අවශ්‍යයි. අවු. 40-50 ත් අතර මාතර ඩිස්ට්‍රික්කයෙන් පිට අය විශේෂයි. විමසීම්: 0741245188 L1021620812-1

මාතර නගරයේ නිවසක නැවතී වැඩ කිරීමට සේවිකාවක් අවශ්‍යයි. 0710 315100. L367460-1

12
වැනි පිටුවට...

මාලබේ ආබාධිත තරුණයෙකුගේ වැඩකටයුතු කිරීමට නිරෝගී පලපුරුදු සාත්තුසේවක මහතෙක් අවශ්‍යයි. වැටුප රු. 40000/-. මාසයකට පසුව වැටුප් වැඩිවේ. 0714482644, 0767344038. L366804-1

මාලබේ පදිංචි විශ්‍රාමික යුවලකගේ නිවසේ නැවතී ආහාර පිසීම, නිවස පිරිසිදු කිරීමට සහය වීමට කාන්තාවකගේ සේවය බලාපොරොත්තුවේ. විමසීම්: 0718592606. L364175-1

මාලබේ පොතුඅරාව පාරේ නිවසක වැඩට ගැහැණු කෙනෙකු අවශ්‍යයි. උදේ සවස දිනකට රු. 900/-. 0778831732. L363321-1

මාවරමණ්ඩිය හෙට්ටියගම හංදිය අසලින් පෙර පාසල් දරුවකු බලා ගැනීමට සහ නිවසේ වැඩ කටයුතු සඳහා සහය දීමට කරුණාවන්ත කාන්තාවක සොයයි. උදේ පැමිණ සවස ගිය හැක. අමතන්න - 0773876827. L359482-1

මිනුවන්ගොඩ නිවසක නැවතී වැඩ කිරීමට කාන්තාවක් අවශ්‍යයි. 0762820451, 0777907082. L363831-1

මිරිහානේ වෛද්‍යවරයෙකුගේ නිවසේ සහ කාර්යාලයේ (නැවතී) සේවය කිරීමට වසර 2 පළපුරුද්ද ඇති (වයස 40-50 අතර) කාන්තාවක් අවශ්‍යයි. බ්‍රෝකර්වරුන් අනවශ්‍යයි. වැටුප 35,000-40,000 අතර. 0777-704887 L352724-2

මිගමුව නුදුරු නිවසක නැවතී සේවය කිරීම සඳහා අවුරුදු 40 වැඩි යුවලක් අවශ්‍යයි. 077-6081444 L364143-1

මිගමුව පිහිටි නිවසක වැඩට (කෑම පිසීමට) කාන්තාවක් අවශ්‍යයි. කෑම, නවාතැන් සමඟ අමතන්න. 0704246726. L366197-1

මිගමුවේ පිහිටි ඉංජිනේරු මහත්මියකගේ නිවසේ ඉවුම් පිහුම් වැඩ කටයුතු සඳහා මනා පුහුණුවක් ඇති කාන්තාවක් අවශ්‍යයි. විමසන්න 0718563704 L366369-1

මිරිගම අවු. 2 1/2 ක දරුවකු සිටින නිවසක නතරවී වැඩපල කිරීමට කැමැති කාන්තාවක් අවශ්‍යයි. අමතන්න. 0778403459. L364595-1

මොරටුව නිවසක නැවතී සේවය කිරීමට අවුරුදු 40ට වැඩි කාන්තාවක් අවශ්‍යයි. වැටුප 30-25 දක්වා. දුරකථන:- 0719-552404 L367179-1

මොරටුවේ පිහිටි නිවසකට ගේ දෙර වැඩ දන්නා (ඉවීමට හැකි) වයස අවු. 40 ඉහළ කාන්තාවක් අවශ්‍යයි. (උදේ සවස යාමට) 0772693797. L362593-1

යක්කල තිදෙනෙක් පමණක් සිටින වෛද්‍යවරයකගේ නිවසක නැවතී සේවය කිරීමට අවු. 60 අඩු කාන්තාවක් අවශ්‍යයි. වැටුප රු. 25,000/-. 0777351569, 0712010042. L363836-1

යක්කල නිවසක නතර වී වැඩ කටයුතු කිරීමට වයස අවු. 40-60 අතර කාන්තාවක් අවශ්‍යයි. අමතන්න 0716585378 වැටුප රු. 20,000/-ත් 25,000/-ත් අතර. L365755-1

යක්කල පැරකුම් මාවතේ පිහිටි නිවසකට, දිවා කාලයේ වැඩිහිටි දෙමාපියන් සමඟ නිවසේ කටයුතුවල යෙදීම සඳහා කාරුණික කාන්තාවක් අවශ්‍යයි. පාගමනින් පැමිණිය හැකි අය පමණක් විමසන්න. වැටුප් සාකච්ඡා කරගත හැක. අමතන්න 0772-907463 L363506-1

යුරෝපයේ පදිංචි නිතර විදේශගත වන තරුණ අවිවාහක පිරිමි කාන්තා රූපලාවණ්‍ය ආනයනය කරන ව්‍යාපාරික මහතකුගේ අපාර්ට්මන්ට් එකේ නැවතී පවුලේ කෙනකු මෙන් සිටිය හැකි, නිතර විදේශගත වීමට කැමැති, බාහිර බලපෑම්වලින් තොර, නිදහස් ජීවන රටාවකට කැමැති, තනි තීරණ ගත හැකි, බටහිර සංස්කෘතියට කැමැති තරුණ ගෘහසේවිකාවක් අවශ්‍යයි. විදේශ රැකියා සඳහා සහාය විය හැක. පුහුණු/ නුපුහුණු අර්ධ කාලීන පෞද්ගලික ලේකම්වරියක් අවශ්‍යයි. 0777379389 L366956-1

රත්මලාන ඉංජිනේරු නිල නිවසක ගෘහ සේවයට සහ දරුවන් බලාගැනීමට නැවතී සේවයට කාන්තාවන් දෙදෙනෙකු සොයයි. වෙනම කාමර වැටුප 25000 රියදුරු සේවයට 06.30-13.00 වැටුප සාකච්ඡා කරගත හැක. වයස අවු. 60ට වැඩි දුක. 071-0523774. L364323-1

රත්මලානේ පිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථානය සඳහා වයස 50 ට අඩු සේවිකාවක් අවශ්‍යයි. (මාස 8 සිට) දරුවන් බලා ගැනීම සඳහා. 0741285640 L364713-1

රාගම තේවත්ත පාර නිවසක සේවය කිරීම සඳහා වයස 30-50 අතර සේවිකාවක් අවශ්‍යයි. 0772446000, 0716486024 L366900-1

රාජගිරිය නිවසක වැඩට සේවිකාවක් අවශ්‍යයි. 0773400846. L359483-1

රු 40,000 අතට ඉදුම් නිටුම් නවාතැන් ආහාර පාන නිල ඇඳුම් සියල්ල ලබාදී නිවෙස්වල නැවතී වැඩිහිටි සාත්තුව අත්දැකීම් ඇති අය. ගැහැණු පිරිමි දෙපාර්ශවයම. ග්‍රාමසේවක සහතිකය සමග සිල්වා මහතා හෝ චන්ද්‍රකාන්ති මහත්මිය අමතන්න. **SA** පදනම නව පාර්ලිමේන්තු පාර. බත්තරමුල්ල පාර්ලිමේන්තුව අසල. 0716166825, 0115732152 L367479-1

රෝගී පියා බලාගැනීමට (කැලණිය) පිරිමි පුද්ගලයෙක් අවශ්‍යයි. වැටුප 35/- T.P. 076-3150114, 0759970272. L361497-1

රෝගී මවත් මාත් සිටින නිවසේ නැවතී සේවයට 60ට අඩු විශ්වාසවන්ත සිංහල, දෙමළ කාන්තාවක් අවශ්‍යයි. වැටුප 35,000/- 0716642766 L364668-1

වත්තල නිවසක නැවතී වැඩ කිරීමට ඉවුම් පිහුම් දන්නා වයස අවු: 65 අඩු පිරිමි පුද්ගලයෙකු අවශ්‍යයි. ආකර්ෂනීය වැටුපක්. 0712421160. L361002-1

වත්තල ප්‍රදේශයේ පිහිටි ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ ප්‍රදර්ශනාගාරයකට සේවක සේවිකාවන් අවශ්‍යයි. 0719078047, 0770432360 L363385-1

වයස 4 සහ 7 දරුවන් දෙදෙනෙක් සිටින නිවසක නැවතී සේවය කිරීමට කාන්තාවක් අවශ්‍යයි. (කඩවත). 0769003401 L361570-1

වයස අවු. 45ත් 50ත් අතර වයසේ පසුවන රසට කෑම සෑදීමට හා අනෙකුත් ගේ දෙර වැඩ කිරීමට හැකි නිරෝගිමත් පිරිසිදු (බුලත් විට නොකන) කාන්තාවක් සොයයි. පඩිය රු. 35000/- ආහාර නවාතැන් පහසුකම් ඇත. දුරකථන අංකය සහිත ලිපිනය සඳහන් ලිපියක් පහත ලිපිනයට යොමු කරන්න එම්. ගිල්බට් 392, සර්පන්ටයින්පාර, බොරැල්ල, කොළඹ 08. මාස 3කට වරක් දවස් 7ක නිවාඩුවක් ලබාගත හැක. L366714-1

ව්‍යාපාරයක නියුතු අපගේ නිවසේ වැඩ කටයුතු සඳහා කාන්තාවක් උවමනාය. එක් දරු කමි නැත. විවාහක යුවලක් උවත් අමතන්න. 0762900021 L360905-1

ව්‍යාපාරික නිවසක ඉවුම් පිහුම් සුළු වැඩ කිරීමට වයස 40-50 නිරෝගී පවුල් බරන් තොර විශ්වාසවන්ත ගෘහසේවිකාවක් අවශ්‍යයි. 30,000/- වැටුප්. 0814947160, 0771088357 L362293-1

ව්‍යාපාරිකයෙකුගේ නිවසේ නැවතී සිටිමින් කාර්යාල කටයුතුවලටද උදව් කලහැකි අවු. 50 අඩු කාන්තාවක් අවශ්‍යයි. පන්නිපිටිය. 077-7720820, 070-2151000. L366508-1

වාද්දුව නගරය තුල නිවසකට වත්ත පිරිසිදු කිරීම සහ අනෙකුත් වැඩ සඳහා පිරිමි අයෙක්ද, එම ගෙදර හොඳින් කෑම පිසීමට හා අනෙකුත් කෑම සැදීමට ද ගෙදර සුද්ධ පවිත්‍ර කිරීම සඳහා මනා දැනීමක් ඇති කාන්තාවක්ද, එහි නැවතී සේවය කල යුතු අතර යහපත් ගතිගුණ ඇති අවු. 40ත් 50ත් අතර යුවලක් අවශ්‍යය. ඉහත සඳහන් පළපුරුද්කම් ඇතිනම් දෙදෙනාටම රු. 55,000ක වේතනයක් දෙනු ලැබේ. වැඩි විස්තර පහත සඳහන් දුරකතන අංකයෙන් පෙ.ව. 8.00ත් ප.ව. 5.00ත් අතර අමතන්න. දුරකතනය 0382232630 L364924-1

වැදගත් නිවසක් සඳහා නිවසක පරිපාලනය දත් කාන්තා සේවිකාවකගේ සේවය අවශ්‍යව ඇත. පියා පුතු හා දියනිය වෙසෙන පිරිසිදු සිංහල කෑම සැකසිය හැකි පවුල් ගැටළුවලින්තොර අයෙකු විමසන්න. වැටුප් සාකච්ඡා කරගත හැක. අමතන්න - 0714804838. L362387-1

වැඩිහිටි දෙදෙනෙක් පමණක් සිටින නිවසක තම නිවස මෙන් නැවතී සිටීමට විශ්වාසවන්ත සේවිකාවක් අවශ්‍යයි. ග්‍රාම නිලධාරි සහතිකය ලබාදිය හැකි අය පමණක් කතා කරන්න. සුදුසු අයට හොඳ වැටුපක් ගෙවමි. 071-1610360, 0741-847383. L364310-1

වැඩිහිටි සීයාව බලාගෙන ගේදෙර වැඩ කටයුතු කිරීමට පිරිමි කෙනකු අවශ්‍යයි. වැටුප රු. 20,000/- කෑම සමඟ. 0772849187, 0772849188 L362869-1

විදේශ රටක සේවය කර ඇති ගෘහසේවිකාවක් අවශ්‍යයි. 077-4771184. L1021621222-1

විශ්‍රාමික ගුරු මෑණියන් කෙනෙකු බලාගෙන දීර්ඝ කාලයක් සිටීමට පිනට ලැදි කාන්තාවක් අවශ්‍යයි. 077-8127524. L366380-1

වෙන්නප්පුව නිවසක නැවතී වැඩ කිරීමට ගැහැණු කෙනෙකු අවශ්‍යයි. 077229554. L360610-1

වේයන්ගොඩ අවට නිවසකට නැවතීමට ගෘහ සේවිකාවක් අවශ්‍ය වී ඇත. වැටුප සාකච්ඡා කර ගත හැක. දු.ක. 0718030128. L366046-1

වේයන්ගොඩ නිවසක සේවය කිරීමට මැදිවියේ කාන්තාවක් අවශ්‍යයි. 0705009952, 0704889952. L362552-1

වෛද්‍ය ගුරු යුවලකගේ නිවසේ නැවතී සේවයට වයස 55-60 අතර ඉවුම් පිහුම් දන්නා සේවිකාවක් අවශ්‍යයි. වැටුප 30,000. 0717953690. L362546-1

වෛද්‍යවරියකගේ නිවසක නැවතී වැඩ කිරීමට කැමති ගෘහ සේවිකාවක් සොයනු ලැබේ. මාසික පඩිය 25,000/- (හොරණ) (071-1472229, 034-2264675) L362139-1

වෛද්‍යවරියකගේ නිවසේ නැවතී සේවය කිරීමට හා 1 1/2ක දරුවකු බලා ගැනීමට 60ට අඩු කාන්තාවක් සොයයි. මාසෙකට දින 4 නිවාඩු. ඉහළ වැටුප්. 0713450584 L361973-1

වෛද්‍යවරියකගේ මාස 4ක් වයසැති දරුවා රැකබලාගැනීමට නිරෝගිමත් කාන්තාවක් අවශ්‍යයි. මාස දෙකකට වුවත් කමිනැත ඉහළ වැටුප්. 038-2243131, 071-0834778. L363205-1

වෛද්‍යවරියකගේ මොරටුව නිවසේ නැවතී ඉවුම් පිහුම් සහ ගෙදර දෙරේ වැඩපල කිරීමට, නීරෝගී කාරුණික සේවිකාවක් අවශ්‍යයි. (වයස අවු. 35-60 අතර) නිතරම ගමේ නොයෙන හෝ කාත් කවුරුවත් නැති නිරෝගී කාන්තාවක් විශේෂයි. 0740985722 L364606-1

වෛද්‍යවරියක් වන මාගේ අවු. 14 දියණිය සමඟ අම්මා කෙනෙක් මෙන් රැක බලාගැනීමට හැකි ප්‍රියමනාප කාන්තාවක් අවු. 30ට වැඩි 55ට අඩු සුදුසු අයෙක් ඉතා ඉක්මණින් අවශ්‍ය වී ඇත. නවාතැන් පහසුකම් සහ සියළුම පහසුකම්. වැටුප 35,000/-. අමතන්න: දිල්හාරි මිස්. 0711978009. L364598-1

සහන උදය වැඩිහිටි විවේකාශ්‍රමයට උපස්ථායක උපස්ථායිකාවන් අවශ්‍යයි. වයස 35-45 විශේෂයි. (රෝගීන් රැකබලා ගැනීමේ පළපුරුද්ද අවශ්‍යයි) වැටුප 25,000/- ඉහළට නේවාසිකව සේවය කල යුතුය. ලේකම් සහන උදය විවේකාශ්‍රම පාලක සභාව අංක 28, ඩී. එස්. කහවිට මාවත, අත්තිඩිය, දෙහිවල. 0712169856 L365654-1

සීදුව, කටුනායක ඉංජිනේරුවරයකුගේ නිවසක එදිනෙද ඉවුම් පිහුම් කටයුතු සහ නිවස පිරිසිදුව තබා ගැනීමට සේවිකාවක් අවශ්‍යයි. නතර වී වැඩ කිරීමට සියලු පහසුකම් ඇත. වැටුප 25,000-35,000ත් අතර. විමසීම් 0762199100, 0773837922 L361926-1

හංවැල්ලේ නිවසක නැවතී දරුවන් දෙදෙනකු බලාගැනීමට අවු. 60ට අඩු සේවිකාවක් සොයයි. රු. 30000/-යි. 0779644669, 0753644669 L360773-1

හම්බන්තොට දිස්ත්‍රික්කයේ කටුවන ප්‍රදේශයේ නැවතී සිට වෛද්‍යවරයෙකුගේ දරුවෙකු බලාගැනීමට මහත්මියක අවශ්‍ය කර තිබේ. 0755973121, 0702083452. L361718-1

හලාවත නිවසකට අවු. 55ට අඩු සේවිකාවන් අවශ්‍යයයි. දු.ක 0763168551 L359763-1

හික්කඩුව බංගලාවක් බලාගැනීම සඳහා වයස 35-50 ත් අතර පිරිමි අයෙක් වහාම උවමනායි. නැවතී වැඩ කළ හැකි දුර පළාත් පමණි. වැටුප 40000/- 45000/- ත් අතර 0766440440 L364739-1

හොරණ දෙදෙනෙකු පමණක් සිටින නිවසක නැවතී හොඳින් ආහාර පිළියෙල කළ හැකි අවු. 45ත් 55ත් අතර නිරෝගිමත් කොරෝනා එන්නත් දෙකම විදගත් කාන්තාවක් අවශ්‍යයි. වැටුප - රු. 35000/- දු.ක. 0772600119 L360982-1

හෝමාගම නිවසේ නැවතී අවුරුදු 1 1/2 වයස ඇති දරුවෙකු බලාගැනීමට කාන්තාවක් අවශ්‍යයි. 0714864822. L361165-1

හෝමාගම ප්‍රදේශයේ නිවසකට ගෘහසේවිකාවක් අවශ්‍යයි. වයස 40-55 අතර. දු. අංකය 0777382612 L359833-1

හෝමාගම රජයේ රැකියාවැති යුවලකගේ නිවසේ නැවතී සේවය කිරීමට වයස 60-65 නිරෝගී කාන්තාවක් ජාතික හැඳුනුම්පත සමග විමසන්න. වැටුප රු. 25,000/- 0112846134 L365683-1

ළමයින් දෙදෙනෙක් බලා ගනිමින් ගෙදර නැවතී වැඩපල කිරීමට කැමති අයෙකු අමතන්න. 0772639056, 0715261560. රත්මලාන අවටින් විශේෂයි. වැටුප් සාකච්ඡා කරගත හැක. L360065-1

කාර්මිකයෝ

0 ගම්පහ පිහිටි කර්මාන්ත ශාලාවක පහත තනතුරු සඳහා ඇබෑර්තු ඇත. කාර්මිකයින් Tig වෙල්ඩර්ස් බොයිලර් ඔපරේටර්ස් ඉලෙක්ට්‍රිශියන්ස් හෙල්පර්ස් රියදුරන්. 0706964964, 0706964968. L363548-1

0 ටිපර් රථවල බක්කි රෙපයාර් කිරීම සඳහා වෙල්ඩින් බාස්වරු හා පේන්ට් කිරීමට පේන්ට් බාස්වරු කොන්ත්‍රාත් ක්‍රමයට අවශ්‍යයි. පාදුක්ක. 0774 545511. L367355-1

00, මාබිම පිහිටි වී පවර් සොලුෂන්ස්, පැනල් බෝඩ් නිෂ්පාදන කර්මාන්ත ශාලාවට විදුලි කාර්මික ශිල්පීන් **(Electrician)** සහ වැද්දුම්කරුවන් **(Welders)** අවශ්‍යයි. අමතන්න - 0703300662 L360179-1

0114540736 ඇලුමිනියම් පැන්ට්‍රි, පාර්ෂන් ටෙම්පර්ඩ්, යකඩ කාප්ප වහලවල්, ෆයිබර්ග්ලාස් (3,500/-) වැනි පිහිලි, වෙන්ඩින් මැෂින් ඔපරේටර්ස්, රියැදුරන්, අත්උදව්කරුවන් (1,500/- 2,000/-) බොරලැස්ගමුව. 0770366821, 0719266967 L1021621522-1

0712210963 වානේ අල්මාරි පේන්ට්කරුවන් සහ වානේ පුටු කුෂන්කරුවන් කොන්ත්‍රාත් පදනමට අවශ්‍යයි. ගමගේ ස්ටීල් ෆර්නිචර් මල්වාන. L365531-1

072 7227228, 076 7905978 වැල්ඩින් කාර්මිකයන්, ස්ප්‍රේ පේන්ට් සහ බිත්ති පේන්ට්, වයරින් සහ නුපුහුණු කාර්මිකයින් කඩිනමින් බඳවාගනු ලැබේ. සීදුව. L367716-1

0741460063 යතුරුපැදි අලුත්වැඩියා ආයතනයකට පලපුරුදු කාර්මිකයන් අවශ්‍යයයි. වැටුප 75000. ප්ලේන්ට්වරු, ප්‍රයිබර්වරු, සෝදන්නන්ද අවශ්‍යයි. ඉහළ වැටුප්. පුහුණු නුපුහුණු කාර්මිකයන්ට NVQ සහතිකයට පුහුණු කෙරේ. කෑම, නවාතැන් නොමිලේ. L366067-1

0761525959 මහරගම ප්‍රදේශයේ පිහිටි ප්‍රසිද්ධ මෝටර් ගරාජයක් සඳහා පුහුණු අවු. 5 වඩා වැඩි සේවා පළපුරුද්ද සහිත කාර්මික ශිල්පීන් සහ විදුලි කාර්මික ශිල්පීන් බඳවා ගනු ලැබේ. ආකර්ෂණීය වැටුප් හා නවාතැන් පහසුකම් හිමිවේ. L366094-1

077-6067960 මහරගම පිහිටි කර්මාන්ත ශාලාවක නඩත්තු අංශය සඳහා සේවකයන් අවශ්‍යයි. 077-6067960 L361238-1

077-8008808 රාජගිරියේ පිහිටි වායු සමීකරණ ආයතනයකට වසර 5ක පළපුරුද්දක් සහිත ඉලෙක්ට්‍රික් හා ඇලුමිනියම් (ආගන්) වැඩ දන්නා වෙල්ඩින් හා ඔටෝ **A/C** කාර්මිකයන් අවශ්‍යයි. L359575-1

0770453854 නාවල පිහිටි සැහැල්ලු වාහන අලුත්වැඩියා කරන ආයතනය සඳහා අවුරුදු 40 අඩු Auto Electrician වරුන් සහ Auto A/C කාර්මිකයින් සහ පුහුණු වීමට කැමති අය අවශ්‍යයි. European වාහන පිළිබඳව දැනුම ඇති අය සඳහා ප්‍රමුඛතාවය. ඔබගේ විස්තර Whatsapp මඟින් හෝ E mail මඟින් එවිය හැක. Email- infor@thushanscarrera.com, Whatsapp- 0770453854 Add- Thushan's Carrera (Automotive care center) No 475/1, Nawala Rd. Rajagiriya. L359900-1

0773482673 ගිල් ගේට්ටු අත් වැටවල් වැඩ දන්නා අය අවශ්‍යයි. නැවතීමේ පහසුකම් ඇත. කඩවත මාවරමණ්ඩිය. L367339-1

0777411186 ඒකල රන්න බටඅත රත්මලාන ආයතනයන්ට විදුලි කාර්මිකයින් වෙල්ඩර්ස් ෆෝර්ක් ඔපරේටර්ස් අවශ්‍යයි. වැටුප 55000 සිට L364870-1

0777784080 මහරගම පිහිටි වෙඩින්හෝල් සහිත A ශ්‍රේණියේ හෝටලයක් සඳහා මෙන්චේනර්වරයෙකු අවශ්‍යයි. 0114-367195. L363364-1

0778571158, 0716807400 හොරණ - පිහිටි රබර් කර්මාන්ත ශාලාවකට ලොරි/ බවුසර් අලුත් වැඩියාව සඳහා පළපුරුදු මෝටර් කාර්මිකයෙක් අවශ්‍යයි. නැවතීමේ පහසුකම් ඇත. ඉහළ වැටුප්. L357985-1

0778751870 කොට්ටාවේ පිහිටි අපගේ සෝලා ආයතනය සඳහා තාක්ෂණික නිලධාරියකු (Technician) අවශ්‍යයි. L367004-1

50,000/- සති පඩි, කමිෂන්, ටිප්, නවාතැන් සහිතයි. ගෘහ භාණ්ඩ ප්‍රවාහන ලොරි රථ සඳහා සහායකයන් අවශ්‍යයි. ඕනෑම කාර්මික අංශයක සුළු හෝ දැනුමක් ඇති, නැවතී සේවය කළ හැකි දුර පළාත්වල අය පැමිණෙන්න. පන්නිපිටිය. 0702345669 L362016-1

AC TECHNICIAN ගෘහස්ථ හා වාහන වායුසමීකරණ ක්ෂේත්‍රයේ දක්ෂ පුහුණු සේවකයන් අවශ්‍ය වේ. අවම වසර 02 ක පළපුරුද්ද, රියදුරු බලපත්‍රය විශේෂයි. වැටුප් සාකච්ඡා කරගත හැක. නවාතැන් පහසුකම් ආහාරපාන (අවශ්‍ය නම් පමණක්) කොලිරිකල් (පුද්) සමාගම දෙපානම, පන්නිපිටිය. 0713531593/ 0704800152 L366945-1

AC කාර්මික ඇබෑර්තු ජාඇල ඒකල වයස අවුරුදු 40ට නොවැඩි NVQ 4 පාඨමාලාවක් හා වසර 3 පළපුරුදු විය යුතුය. 0761487212, 0714162132. L366579-1

AC ටෙක්නීෂන් හා ඉලෙක්ට්‍රීෂන්වරු සඳහා ඇබෑර්තු ඇත. මාලබේ. 076 0986466. L367477-1

AC සවිකිරීම සර්විස් සාමාන්‍ය දැනුම ඇති හා පළපුරුදු ඇබෑර්තු. පඩිය රු. 55000/- වැඩියෙන් නවාතැන් ඇත. සිංගර් සර්විස්, රෙප එයාර් මාකොළ. 0777554575, 0717554575 L367320-1

ALUMINUM Fabrication ආයතනයකට පළපුරුදු Fabricator වරුන් හා පුහුණු අත්උදව්කරුවන් අවශ්‍යයි. නවාතැන් පහසුකම් ඇත. තලාහේන, මාලබේ. 0773737303. L364184-1

ARC Welding / Tig Welding / Aluminum සඳහා පුහුණු සේවකයින් අවශ්‍ය කර ඇත. 0711717605, 0779521135. L364971-1

AUTO A/C ප්‍රධාන පෙළේ ආයතනයකට නවීන වාහන පිළිබඳව මනා පළපුරුදු ඇති කාර්මිකයන් ඉතා ඉක්මණින් අවශ්‍යයි. මූලික වැටුප රු. 50,000 කට වැඩි අමතර දීමනාද සහිතයි. අංක 559 තලංගම බත්තරමුල්ල. 0755126706 L367264-1

AUTO A/C ශීතකරණ සෑදීම සඳහා පුහුණු/ නුපුහුණු කාර්මික ශිල්පීන් අවශ්‍යයි. වාද්දුව පානදුර කළුතර අවටින් විශේෂයි. ඉහළ වැටුප්. විමසීම්:- 0775316736, 0773365610. L366833-1

BAJAJ Service ත්‍රිරෝද රථ කාර්මිකයින් සහ සේදුම්කරුවන් අවශ්‍යයි. ආකර්ෂණීය වැටුප්, ඉඳුම් හිටුම්. මාකඳුර. 076-9205715. L363264-1

CNC Lathe/ Milling සඳහා පිළිගත් කාර්මික තාක්ෂණ ආයතනයක පුහුණුවට ලත් යන්ත්‍ර ක්‍රියාකරුවන් සඳහා ඇබෑර්තු ඇත. cityen1@gmail.com 0776116016. L363790-1

ELECTRICAL Technicians wanted. Who are able to handle repairs of Power Generators, Diesel Engines, Alternators, Electric Motors, Governors, Troubleshooting & repairs in ATS Panels. Email: engineering2@esnaallied.com Tel: 0768232406, 0768232401 L1021621507-1

Welders, Fitters පෑස්සුම්කරුවන්, වෑස්දුම්කරුවන් මාලබේ පිහිටි පිළිගත් සමාගමක් සඳහා පුහුණු/නුපුහුණු සේවකයන් ඉක්මණින් අවශ්‍යයි. නවාතැන් නොමිලේ. දක්ෂතාවය මත වැටුප රු. 35,000/- සිට ඉහළට අතිකාල හා වෙනත් දීමනා අදම අමතන්න 0703027282, 0718733113 ලෙව්ලින් හෝල්ඩිංස් (පුද්) සමාගම, 597/2, අතුරුගිරිය පාර, මාලබේ. L367372-1

MOTOMARK Automobile Pvt (Ltd) මාලබේ පිහිටි වාහන අලුත්වැඩියා කිරීමේ අප ආයතනයට දක්ෂ පලපුරුදු මෝටර් මැකෑනික්වරයෙකු අවශ්‍යකර තිබේ. කෑම සහ නවාතැන් පහසුකම් නොමිලේ. වැටුප පැමිණ සාකච්ඡා කරගත හැක. විමසීම්: 076-1966183, 0117-831199. L366681-

අංකුම්බ්‍රා තේ කර්මාන්තශාලාවට වාහන විදුලි සහ ටින්කරින් කාර්මිකයන් අවශ්‍යයි. විමසන්න 0662224254 ඊමේල්: meezans@sltnet.lk 392, ප්‍රධාන වීදිය, මාතලේ L364317-

අත්තිඩියේ වාහන නඩත්තු කිරීමේ ආයතනයක් සඳහා දක්ෂ මැකෑනික්වරු හා පේන්ටර්වරු අවශ්‍යයි විමසීම: 0716269998. L362330-

අති දක්ෂ වාහන පින්තාරු කිරීමට පලපුරුදු සේවකයකු අවශ්‍යයි ඉඳුම් හිටුම් කෑම බීම දෙනු ලැබේ විමසීම් 0775881100, 0718881700 L364800-

අනුරාධපුර වාහන අලුත්වැඩියා සහ සේවා කරන ආයතනයක් සඳහා පලපුරුදු පෙට්‍රල්/ ඩීසල් මැකෑනික්වරු, ලියවන පට්ටල් ක්‍රියාකරුවන්, හයිබ්‍රිඩ් වාහන කාර්මිකයින්, Auto-Electrician Auto A/C කාර්මිකයන්, බොඩි පින්තාරුකරුවන්, ටින්කර්වරු ජැක් බාස්වරු, වාහන සෝදු පිරිසිදු කරන්නන් (ගැහැණු/ පිරිමි) ඇලුමිනියම් ෆැබ්රිකේටර්වරු, Single & Three Phase වයරින් කරන්නන් ග්‍රිල් ගේට්ටු වහලවල් සැකසිය හැකි වැල්ඩර්වරු වහාම අවශ්‍යයි. (අතිකාල දීමනා, නවාතැන් හා ආහාරපාන සැපයිය හැක) 0741007312 0741007308, 0741007307 0712484522, 0252223740 L367242-1

අප ආයතනය සඳහා පහත ඇබෑර්තු ඇත. ඩීසල්, පෙට්‍රල් මැකෑනික්වරුන්, වාහන පින්තාරුකරුවන් ෆෝමන්වරුන්, Wego Lanka Holding (PVT) Ltd Kottawa 0771380090/ 0112197470 L366953-

අප ආයතනය සඳහා පළපුරුදු ගොඩනැගිලි ඉදිකිරීම් අත්උදව්කරුවන් (Labours) අවශ්‍ය කර ඇත කොළඹ අවට (රත්මලාන) අදම අමතන්න. 0763600517 0774222111 L359812-

අප ආයතනය සඳහා පළපුරුදු පලන්ච් කොන්ත්‍රාත්කරු (Palanch Contractor) උස් ගොඩනැගිල්ලක වැඩ කළ යුතුය. කොළඹ අවටින් විශේෂයි. ලිපිනය 101, Sri Sumangala road Rathmalana අමතන්න. 0763600517, 0774222111 L359810-1

අප ආයතනයට ඇලුමිනියම් කොන්ත්‍රාත්කරුවන් අවශ්‍යයි පාර්ටිෂන්, සිවිලිං පිළිබඳ දැනුම අවශ්‍යයි. නොකඩවා ව්‍යාපෘති ඇති අතර විශේෂ ගෙවීම්. වසර 20 පවත්වාගෙන යන ආයතනයකි. 0112-439293, 0114-621029, 0714-572165 ජේ.එන්. ඉන්ටීරියර් පුද්ගලික සමාගම, 129, ජයන්ත වීරසේකර මාවත, කොළඹ 10. L361234-1

අප ආයතනයට ටාටා ලේලන්ඩ් කැබින් සෑදීම සඳහා ටින්කර් මහතුන් ටිපර් බකට් සඳහා යකඩ වැඩ වෙල්ඩින් වැඩ දන්නා සේවක මහතුන් තහඩු නැවීම කැපීම සඳහා සේවක මහතකු සමඟ අත්උදව්කරුවන් අවශ්‍යයයි. ටී.එල්.එම්. ඉංජිනියරින්, රණාල. 0773658812 L364465-

අප ආයතනයට ටින්කරින් බාස් මෝටර් මැකෑනික් වහාම අවශ්‍යයි සිත්ගන්නාසුළු වැටුප්. සේන මිල්ස් රිෆයිනරිස්, අංක 40, බේස්ලයින් පාර, ඔරගොඩවත්ත, කැලණි තිස්ස විදුලි බලාගාරය අසල. දුරකතන අංක 0770137422. L363809-

අප ආයතනයට දක්ෂ වෙල්ඩින්වරුන් අවශ්‍යයි. ග්‍රිල් ගේට්ටු හොවන, අවු 35 අඩු පාඨමාලාවක් හැදෑරූ අයට ප්‍රමුඛතාවය. වැටුප 2500/- නුගේගොඩ 0718367396. L363500-

අප ආයතනයට පළපුරුදු වාහන ටින්කර්වරු, පේන්ටර්වරු, ඔටෝ ඉලෙක්ට්‍රීෂියන්, මිකැනික්වරු වහාම අවශ්‍යයි. නවාතැන් නොමිලේ. විස්කම් ඔටෝ ඉංජිනියරින්, මාතලේ. 0712496896 L363741-

13 වැනි පිටුවට...

අප ආයතනයට පුහුණු/ අර්ධ පුහුණු ලියමන පට්ටල්කරුවන් අවශ්‍යයි. වැටුප කථාකර ගත හැක. 0770336380 L360692-1

අප ආයතනයට වෙල්ඩින් වැඩ දන්නා Welders අවශ්‍යයි. පළපුරුදු අය විශේෂයි. දිනක වැටුප රු. 3500/- පැය 3කට අතිකාල දීමනාව රු. 1312/50 සම්පූර්ණයෙන් දිනකට රු. 4812/50 පමණ මුදලක් උපයාගත හැක. නවාතැන් පහසුකම් සපයනු ලැබේ. අබණ්ඩව ව්‍යාපෘති ඇත. දිනපතා වියදම් මුදල් සහ සතිපඩි. 0114-621029, 0112-439293, 0714-572165 (කරුණාකර කාර්යාල වේලාවන් තුලදී පමණක් අමතන්න) ජේ.එන්. ඉන්ටර්රයස් පුද්ගලික සමාගම, නො. 129, ජයන්ත වීරසේකර මාවත, කොළඹ 10. L361231-1

අප ආයතනයට හයිඩ්‍රොලික් අත්උදව්කරුවන් ලර්ත්මැෂින් ක්‍රියාකරුවන් අවශ්‍යයි. (පුහුණු/ නුපුහුණු) නවාතැන් පහසුකම් ඇත. 0777658562, 0112171245 L365343-1

අප ආයතනයේ රථවාහන සේදුම් අංශය සඳහා සේවකයින් බඳවා ගැනේ. පළපුරුද්ද අවශ්‍ය නොවේ. (වයස අවු. 18 - 45) කුරුණෑගල, මහනුවර, මාතර යුනයිටඩ් මොටර්ස් ලංකා- විමසීම් 076-9118212. L361892-1

අප මිනුවන්ගොඩ, දිවුලපිටිය යතුරුපැදි සේවා නියෝජිත මධ්‍යස්ථානයන්ට පුහුණු නුපුහුණු කාර්මිකයන්, සේදුම්කරුවන්, ලිපිකරුවන් අවශ්‍යයි. ඉහළ වැටුප් දීමනා නවාතැන්. 0763169350. L366638-1

අබාන්ස් ආයතනයේ අනුබද්ධ ආයතනයක් වන ක්‍රුවුන් සිටි ඩිවෙලොපර්ස් පුද්ගලික සමාගම සඳහා ඩීසල් කාර්මික ශිල්පීන් සහ සහයකයින් සඳහා ඇබෑර්තු ඇත. ක්‍රුවුන් සිටි ඩිවෙලොපර්ස් පුද්ගලික සමාගම, නො. 793/28, ලියනගේමුල්ල, සීදුව. අමතන්න. 0717479017, 0713493177. L364477-1

අමානෝ වහල වැඩ සහ වෙල්ඩින් කාර්මිකයන් අවශ්‍යයි. වැටුප කථාකරගත හැක. නවාතැන් ඇත. 0777914977 L365629-1

අමිල මෙටල් ක්‍රාෆ්ට් පුද්ගලික ආයතනයෙහි, ප්ලාස්ටික් මෝල්ඩ් කැපිය හැකි පළපුරුදු සේවකයන් සහ මැෂින් ඔපරේටර්වරුන් අවශ්‍යයි. දුර.අං: 011-2650261, 076-9682520 L365459-1

අර්ධකාලීන වැඩට (ඒ/සී, වතුර පයිප්ප සහ ශීතකරණ) අළුත්වැඩිය කළ හැකි විදුලි කාර්මික ශිල්පිවරයෙකු RIVI RAS Hotel සඳහා උවමනා කර ඇත. සම්මුඛ පරීක්ෂණ 2021 නොවැම්බර් 15 දින සඳුද සහ 16 වෙනි ඉඟහරුවාදා පෙ.ව 10.00 සිට දහවල් 12.00 දක්වා ගල්කිස්ස ද සේරම් පාර, නො. 50/2 හිදී පැවැත්වේ. කරුණාකර කථා කරන්න. 0773506250 පෙ.ව. 8.00 සිට ප.ව 05.00 දක්වා. L360203-1

අලුත් ගරාජයක් සඳහා හයිබ්‍රිඩ් හා ඔටෝ ගියර් දැනුම ඇති හෙඩ් බාස් කෙනෙකු අවශ්‍යයි. ඉහල වැටුප් දු.අ. 0701017014, 0704261711 L367245-1

අවශ්‍යයි. වාහන ටින්කර් හා පේන්ටිවරුන් නවාතැන් හා කෑම ඇත. වැටුප 2000-3000 දක්වා මාලබේ. 0714142733 L365318-1

ආහාර ඇසුරුම්කරණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු/ නුපුහුණු අවශ්‍යයි. රියපුරු බලපත්‍රය ඇත්නම් විශේෂයි. 0777622051 වත්තල පිහිටි ආයතනයකි. L360500-1

ඇලුමිනියම් කර්මාන්ත ශාලාවක වැඩකිරීම සඳහා සේවකයන් වහාම අවශ්‍යයි. නවාතැන් ඇත. 0706400200/ 0706900200 L364841-1

ඇලුමිනියම් ක්ෂේත්‍රයේ නියුතු ප්‍රමුඛ පෙලේ ආයතනයක් සඳහා දක්ෂ පළපුරුදු ඇලුමිනියම් වැද්දුම්කරුවන් සහ අත්උදව්කරුවන් අවශ්‍යයි. (වෘත්තීය පුහුණු) කොට්ටාව 0777955556 L367333-1

ඇලුමිනියම් ක්ෂේත්‍රයේ නියුතු ප්‍රමුඛ-පෙලේ ආයතනයක සුලු වැඩ සඳහා යකඩ වැද්දුම්කරුවකු අවශ්‍යයි. කොට්ටාව (නවාතැන් කෑම ඇත) 0777955556 L367344-1

ඇලුමිනියම් දෙර ජනෙල් පැන්ට්‍රි කබඩ් වැඩ සඳහා බාස්වරු හා ගෝලයින් අවශ්‍යයි වැටුප් 3000/- සිට 0778661623 L365524-1

ඇලුමිනියම් පාටිෂන් සහ සිවිලින් වැඩ සඳහා නුපුහුණු සේවකයන් අවශ්‍යයි. වැටුප 30000/- නවාතැන් ඇත. පන්නිපිටිය. 0717176666 L365294-1

ඇලුමිනියම් වැඩ දන්නා දක්ෂ බාස් කෙනකු (පැන්ට්‍රි කබඩ්) රත්නපුර අවටින් සොයයි. 0718722207 L361567-1

ඇලුමිනියම් වැඩ දන්නා බාස්වරුන් හා ගෝලයන් සඳහා ඇබෑර්තු. පිටස්තර සේවකයින් සඳහා නවාතැන් පහසුකම්. සාකච්ඡා කළ හැකි වැටුප්. 0764116273 www.erora.lk L367089-1

ඇලුමිනියම් වැඩ සඳහා පුහුණු/ නුපුහුණු සේවකයින් අවශ්‍යයි. පිළියන්දල 0775040468 L360655-1

ඇලුමිනියම් වෑද්දුම් වැඩ සඳහා පුහුණු නුපුහුණු සේවකයින් අවශ්‍යයි. නේවාසික පහසුකම් ඇත. වැටුප් 1200/- 3000/- දක්වා 103, පරණ කැස්බෑව පාර, ගංගොඩවිල, නුගේගොඩ. 0787288288, 0772426626. L363871-1

ඇලුමිනියම් ෆැබ්රිකේෂන් වැඩ පිළිවෙලකට කල හැකි අවුරුදු 40 අඩු පළපුරුදු දක්ෂ ශිල්පීන් උපකොන්ත්‍රාත් ලබාදීමට කිරිබත්ගොඩ වැඩපලකට අවශ්‍යයි. ආවුදු උපකරණ නොමිලේ. 0750766453 L363573-1

ඉබ්බාගමුව ප්‍රසිද්ධ RENT A CAR ආයතනයකට අවුරුද්දක පලපුරුද්දෙ ඇති ටින්කර් පේන්ටර්. වාහන වයරින් බාස්වරු හදිසියේ අවශ්‍යයි. කෑම බීම නවාතැන් නොමිලේ. 0768603938, 0728293938. L360174-1

ඔටෝ ඉලෙක්ට්‍රික්වරු හා ඔටෝ ACවරු අවශ්‍යයි. දෙකම දන්නා අයට 80,000/-ක වැටුපක්. 0777719227 L365830-1

ඔස්ටින් කාර් රථ ගැන දැනුමක් ඇති ටින්කර් පේන්ටි බාස් කෙනෙකු උවමනායි. ආහාර නවාතැන් නොමිලේ. දෙහිවල. 0779611394 L364731-1

කටුනායක පිහිටි ව්‍යාපෘතියක් සඳහා කටුනායක අවටින් පුහුණු/ නුපුහුණු විදුලි කාර්මිකයන් අවශ්‍යයයි. ආකර්ෂණීය වැටුප්. අමතන්න. 0715308673 L364402-1

කඩවත නගරයට නුදුරින් ගණේමුල්ල පාරේ පිහිටා ඇති ආයතනයකට වෙල්ඩින්කරුවන් (විදුලි කාර්මික දැනුමක් ඇති. ස්ප්‍රේ පේන්ට්වරු කම්මල්කරුවන්, වැඩ පුහුණුවන්නන් වහාම අවශ්‍යයි. දවස් පඩි/ මාස් පඩි කොන්ත්‍රාත් පදනම මත වැටුප් ගෙවනු ලැබේ. 0112921159, 0114340786, 070-1274885. L364580-1

